සම්පත්වල සුළු වැඩිවීම තුළින් 1980 දී වූ පහළ මට්ටමේ වර්ධන අනුපාතයත්, ආනයන පරිමාවේ අඩු වීමත් යන කරුණු දෙකම පිළිබිඹු වෙයි. මූර්ත වටිනාකම් අනුව සම්පත් බෙදී ගිය ආකාරය විමසා බලන කල සම්පත් වලින් සියයට 59 ක් පරිභෝජනය සඳහාද, සියයට 19 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහාද සියයට 21 ක් අපනයන සඳහා වෙන් වී ඇතිබව පෙනේ. 1979 වසරේදී සම්පත් ප්‍රමාණයෙන් සියයට 61 පරිභෝජනය සඳහාත් සියයට 16 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහාත් වියදම් වී ඇත. ඒ අනුව බලන කළ මෙම වසරේදී පරිභෝජනයේ සිට ප්‍රාග්ධන සම්පාදනය කරා සම්පත්හි මාරුවීමක් දක්නට තිබේ.

මූර්ත වශයෙන් බලන කල පරිභෝජනය සියයට 6·7 කින් හා ප්‍රාග්ධන සම්පාදනය සියයට 25 කින් වැඩි වී තිබේ. එය 1979 දී පිළිවෙලින් සියයට 9 කින් හා සියයට 20 කින් වැඩි වී තිබුණි. 1980 අපනයන පරිමාව 1979 වසරේ මට්ටමෙන්ම පැවතුණි. ඒ අනුව පසුගිය වසරයන්හි පැවති උපනතිය නොකඩවාම සිදුවිය. 1979 දී මූර්ත අපනයන කොටසෙහි වැඩිවීම මඳ වශයෙන් විය.

1 · 7 සංඛ්‍යා සටහන

ඉතුරුම්

රු. දශලක්ෂ

| ශීර්ෂ | 1978* | 1979* | 1980* |
|---|---|---|---|
| 1· වෙළඳ මිළ අනුව දළ ජාතික නිෂ්පාදනය .. | 42,428 | 52,147 | 68,271 |
| 2· විදේශ සම්පත් (භාණ්ඩ හා සාධක නොවන සේවාවන්හි ශුද්ධ ආනයනය) .. | 2,274 | 6,549 | 15,279 |
| 3· ආයෝජන .. | 8,554 | 13,527 | 24,466 |
| 4· ඉතුරුම් (3 – 2) . | 6,280 | 6,978 | 9,187 |
| 5· ඉතිරි කිරීම් අනුපාතය (4 එකෙහි ප්‍රතිශතයක් ලෙස) .. | 14·8 | 13·4 | 13·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* තාවකාලික ඇස්තමේන්තු.


පවත්නා ඇස්තමේන්තු අනුව රටේ ඉතුරුම් ප්‍රමාණය මේ වසරේදී රුපියල් දශ ලක්ෂ 9,187 ක් වෙයි. එය 1979 ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 6,978 හා සසඳා බලන කල සියයට 32 ක වැඩිවීමකි. කෙසේ වුවද දළ ජාතික නිෂ්පාදිතයෙහි ඉතුරුම් අනුපාතය 1979 පැවති මට්ටමටම කිට්ටු සියයට 13·5 ක් වේ. මෙයින් පැහැදිලි වන්නේ රටේ උද්ධමනකාරී පීඩනයක් පැවතුනද ඉතුරුම් අනුපාතයෙහි අඩුවීමක් සිදු වී නැති බවය.

## කෘෂිකර්මය

වී වගා අංශය සම්බන්ධයෙන් හැර, 1980 වර්ෂය තුළදී කෘෂි අංශයේ ක්‍රියාකාරිත්වය නැවත වරක්, බලාපොරොත්තු වූවාට වඩා පහළ මට්ටමක විය. 1980 දී කෘෂිකාර්මික නිෂ්පාදනයේ වර්ධන අනුපාතය 1979 දී 2 ක් වූ වර්ධන අනුපාතයට වඩා සුළු වශයෙන් වැඩිව 2·9 ක් විය. 1978 සහ 1977 වර්ෂයන්හි අදාළ වර්ධන අනුපාතයන් පිළිවෙලින් සියයට 4 ක් සහ සියයට 7 ක් විය. 1979 සහ 1980 වර්ධන අනුපාතයන් ජනගහණයේ වැඩි වීම සමඟ ගැලපුවහොත්, ලැබෙන ඒක පුද්ගල වර්ධන අනුපාතය ඇත්තවශයෙන්ම බලාපොරොත්තු කඩ කරවන සුළුය. ප්‍රධාන වැවිලි භෝග අංශයේ නිෂ්පාදනයේ පහත වැටීම නිසා අපනයන සඳහා ඇති අතිරික්තයන් අඩු විය. 1980 දී තේ නිෂ්පාදනය සියයට

# ප්‍රධාන කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය

වාර්ෂිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

7 කින් පහත වැටුණු අතර[1], රබර් නිෂ්පාදනය සියයට 13 කින් පහත වැටිණි. පොල් නිෂ්පාදනය සියයට 15 කින් පහත වැටුණි. සුළු අපනයන භෝග අංශයේ නිෂ්පාදනයද පහත වැටුනා හෝ 1979 නිෂ්පාදන මට්ටමට බොහෝදුරට සමාන මට්ටමක පැවතුනා හෝ විය හැකිය.

1979 දී සියයට එකක සුළු අඩු වීමක් පෙන්නුම් කළ ක්ෂෙත්‍ර භෝග අනු අංශයේ, වී නිෂ්පාදනය 11 කින් වැඩි විය. අතුරු ආහාර භෝග වගා අංශයේද නිෂ්පාදනයේ සුළු වැඩි වීමක් වාර්තා විය. ඉකුත් වසරේදී සියයට 25 ක පමණ අඩු වීමක් පෙන්නුම් කළ සීනි නිෂ්පාදනය, 1980 දී එම උපනතියට පටහැනිව යමින් සියයට 43 ක වැඩි වීමක් පෙන්විය. ධීවර සහ සත්ව නිෂ්පාදන අංශයන්හිද සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණ. ධීවර මෙන්ම කිරි නිෂ්පාදනයද සියයට 8·8 කින් වැඩි වූ අතර, බිත්තර නිෂ්පාදනය සියයට 26 කින් වැඩි විය.

සමස්ථයක් වශයෙන් ගත්කල, කෘෂිකාර්මික අංශයේ වසර කිහිපයක් මුළුල්ලේ නොකඩවා දක්නට ලැබුණු බලාපොරොත්තු කඩ කරවන සුළු ක්‍රියාකාරිත්වය දැඩි විමසිල්ලට භාජනය විය යුතු කරුණකි. නිරිතදිග මෝසම් වර්ෂාව නොලැබීම තේ සහ පොල් නිෂ්පාදනයට අහිතකර අයුරින් බලපෑවේය. එසේ වුවද, 1979 වාර්ෂික වාර්තාවේද අවධාරනය කරන ලද පරිදි කෘෂි අංශයේ අසමාන ක්‍රියාකාරිත්වයට, රාජ්‍ය වැවිලි අංශයේ කළමනාකරණ ගැටළු, පාරම්පරික අපනයන භෝග සඳහා වූ බදු ව්‍යුහය සහ කුඩා වැවිලි හිමියන්ගේ නිෂ්පාදනය වැඩි කිරීමට ප්‍රමාණවත් දිරිගැන්වීමක් නොමැති වීම වැනි පාලනය කළ හැකි කරුණු ගණනාවක්ද හේතු විය.

වී වගා අංශයට දෙන ලද දිරිගැන්වීම්වලින් බෙහෙවින් සතුටුදයක ප්‍රතිඵල ලැබී ඇත. කෘෂි යෙදවුම් රැසකම මිළ ඉහළ ගියද, ගොවීනට ප්‍රමාණවත් ආදයමක් ලබා ගත හැකි වන පරිදි, විවෘත වෙළඳපොළේ වී සඳහා ඉහළ මිලක් පැවතීමේ මූලික හේතුව නිසා 1980 වර්ෂයේ වී නිෂ්පාදනය ඉහළ ගියේය. 1980 වර්ෂයේ මුල භාගයේදී බුසලක් රු. 46 ක් පමණ වී යැයි ගණන් බලන ලද විවෘත වෙළඳපලේ සාමාන්‍ය වී මිල වර්ෂයේ අග භාගයේදී බුසලකට රු. 58 දක්වා වැඩි විය. 1980 වර්ෂයේදී ගොවීන්ගෙන් වැඩිදෙනෙක් සිය නිෂ්පාදනය පුද්ගලික වෙළෙඳුන්ට අලෙවි කළ අතර, වී අලෙවි මණ්ඩලයට මිලදී ගත හැකි වූයේ මුළු නිෂ්පාදනයෙන් සියයට 10 ක් වන මෙට්‍රික් ටොන් 211,000 ක් පමණි. 1979 දී වී අලෙවි මණ්ඩලයට මුළු වී නිෂ්පාදනයෙන් සියයට 28 ක් නැතහොත් මෙට්‍රික් ටොන් 541,000 ක් මිළදී ගැනීමට හැකි විය. 1979 නොවැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද පොහොර සහනාධාරයේ වැඩි කිරීමද අපේක්ෂිත පරිදි පොහොර භාවිතය වැඩි කිරීමට ඉවහල් වූ අතර, එමගින් ඉහළ ඵලදවක් මෙන්ම අක්කරයක ඵලදවද වැඩිකර ගැනීමට හැකි විය. 1980 දී වී නිෂ්පාදනය සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය සියයට 97 කින් වැඩි වී ඇත.

ප්‍රධාන පොල් වගා ප්‍රදේශයන්හි පැවති වියළි කාලගුණික තත්වයද, පොල් නිෂ්පාදනය සැළකිය යුතු තරම් අඩු වීමට මූලික වශයෙන් හේතු විය. දිගින් දිගටම පැවති වියලි කාලගුණික තත්වයන් නිසා මෑත වර්ෂවල දක්නට ලැබුණු පොහොර භාවිතයේ වැඩි වීමෙන් ලබාගත හැකිව තිබූ හිතකර ප්‍රතිඵල නොලැබී ගියේය.

තේ වගා අංශයටද 1980 තුළ දී වියලි කාලගුණික තත්වය තදින්ම බලපෑ අතර, දක්නට ලැබුනු පහත් නිෂ්පාදන මට්ටමට, වසර ගණනාවක් තුළ පැවති දුර්වල කළමනාකරණයද, සංස්ථාවලට මුහුණ් පෑමට සිදුවූ මුදල් අපහසුකම්ද, ඉහළ නැගෙමින් පැවති නිෂ්පාදන වියදම් සහ කම්කරුවන්ගේ හිඟයද හේතු වන්නට ඇත. රබර් වගා අංශයේ 1980 නිෂ්පාදනය අඩු වීමට මූලික වශයෙන් හේතු වූයේ වසර ගණනාවක් තිස්සේ රබර් නැවත වගා කිරීම

1. 1980 තේ අපනයනය සියයට 2 කට අඩු ප්‍රමාණයකින් පහත වැටිණි. මෑත වර්ෂවල රේගු වාර්තාවල සඳහන් තේ අපනයන පරිමාව, වාර්තාගත නිෂ්පාදනය, ගණන් බලන ලද පරිභෝජනය සහ තොග වෙනස්වීම් අනුව බලන කල අපනයනය කළහැකිව තිබූ ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩි විය.

නොසළකා හැරීම නිසා පරණ රබර් ගස් ප්‍රමාණය වැඩි වීමත්, ඉඩම් නියම ආකාරයෙන් නඩත්තු නොකිරීමත්, නැවත වගාව සඳහා ගස් ඉදිරීමෙන් රබර් කිරි කැපෙන බිම් ප්‍රමාණය අඩු වීමත් යනාදී කරුණුය.

ප්‍රධාන වශයෙන්, විශාල පරිමාණ නිෂ්පාදකයින් කිහිප දෙනෙකු නිෂ්පාදන කටයුතුවලට ඉදිරිපත් වීම නිසා 1980 දී සත්ව නිෂ්පාදන අංශයේ කුකුලන් ඇතිකිරීමේ කටයුතුවල සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබිණ. රජයේ සහනාධාරයන් මගින් සත්ව ආහාර මිළ පහත් මට්ටමක තබාගත හැකි වීම කර්මාන්තය පුළුල් වීමට උපකාරී විය. ධීවර අංශයේද වර්ධන ලක්ෂණයන් දක්නට ලැබිණ. පොදු අංශයේ ධීවර නිෂ්පාදනය අඩු වීමට සරිලන පරිද්දෙන් 1980 දී පුද්ගලික අංශයේ ධීවර නිෂ්පාදනය වැඩි විය. විශාල වශයෙන් අඩු කරන ලද සහනාධාර මිළ ගණන්වලට ධීවර ආම්පන්න සහ අනිකුත් ප්‍රාග්ධන උපකරණ සපයනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1980 දී ධීවර නිෂ්පාදනය සියයට 9 කින් වැඩි වී ඇතැයි ගණන් බලා ඇත. 1980 දී ධීවර සංස්ථාවේ ක්‍රියාකාරිත්වයේ විශේෂ ලක්ෂණයක් වූයේ මාළු මිළදී ගැනීම කෙරෙහි වැඩි අවධාරණයක් දක්වනු ලැබීමයි. මෙසේ මිළදී ගත් මාළු ප්‍රමාණය ඉකුත් වර්ෂයට වඩා සියයට 30 කින් වැඩි වී ඇත. අනික්අතට, වැඩි වශයෙන්ම දෙරට අතර පැවති සම්මුතියක් කල්පිරී අවලංගුවීම නිසා ඉන්දියාවේ දකුණු වෙරළේ 'වොජ් බෑන්ක්' ප්‍රදේශයේ මසුන් ඇල්ලීමට සංස්ථාවේ ට්‍රෝලර් යාත්‍රා අපොහොසත් වීම නිසා සංස්ථාවේ මාළු නිෂ්පාදනය, සියයට 48 කින් අඩුවී ඇති බැව් දක්වේ. කෙසේ වුවද, මසුන් මිළදී ගැනීම වැඩි වීම නිසා ධීවර සංස්ථාවේ මුළු මාළු සැපයුම විමසිල්ලට භාජනය වී ඇති වසරේ සියයට 13 කින් වැඩි වී ඇති බැව් පෙනේ.

නෙදර්ලන්ත රජයේ සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ සහයෝගය ඇතිව, 1980 දී ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය මගින් කිරි පට්ටි සංවර්ධන යෝජනා ක්‍රම කිහිපයක් පවත්වාගෙන යන ලදී. 1980 දී ජාතික කිරි මණ්ඩලයේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩිවී ඇත. 1980 දී අනුගමනය කරනු ලැබූ ප්‍රතිපත්තීන් සහ අනිකුත් ක්‍රියා මාර්ගවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබීම නිසා කිරි නිෂ්පාදනය වැඩි විය. තාවකාලිකව ගණන්බලා ඇති පරිදි 1980 දී දිවයිනපත කිරි නිෂ්පාදනය සියයට 9 කින් වැඩි වූ අතර, ජාතික කිරි මණ්ඩලයේ සංඛ්‍යා ලේඛනවලට අනුව දියර කිරි නිෂ්පාදනය සියයට 6 කින් වැඩි වී ඇති බැව් හෙළි වේ.

1980 වසර තුළදී ද වැදගත් ආයතනික වෙනස්වීම් කිහිපයක් සිදු විය. රජය සතු වැවිලි සංස්ථා දෙක ජනතා වතු සංවර්ධන අමාත්‍යංශය නමින් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි අමාත්‍යංශය නමින් ප්‍රතිසංස්ථාපනය කරනු ලැබීමෙන්, ප්‍රතිසංවිධානයක් ඇති කරන ලදී. ප්‍රාදේශීය මණ්ඩල ඇති කරනු ලැබීමෙන් සංස්ථා දෙකෙහි වැඩ කටයුතු තවදුරටත් විමධ්‍යගත කරන ලදී. ජනවසමේ ප්‍රාදේශීය මණ්ඩල හැටන්, මහනුවර, බදුල්ල, සහ කෑගල්ල යන ප්‍රදේශවල ඇති කරනු ලැබූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි ප්‍රාදේශීය මණ්ඩලයන් හැටන්, නුවරඑළිය, කළුතර සහ ගාල්ල යන ප්‍රදේශවල පිහිටුවන ලදී. විමධ්‍යගත කිරීමේ කටයුතු වලින් වතු පාලනයේ ක්ෂණික දියුණුවක් ඇතිවී නැත්තේ බලතල පැවරීම සඳහා තවමත් කොළඹ ප්‍රධාන කාර්යාලය එතරම් කැමැත්තක් නොදක්වන හෙයිනි. මෙම පියවරෙහි හිතකර ප්‍රතිඵලයක් මුළුමනින්ම ලබාගත නොහැක්කේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම තවමත් මධ්‍යගතව පවතින හෙයිනි.

වී වෙළඳ පළෙහි 'මිල නියමුවෙකුගේ' සහ පූර්ණ ඒකාධිකාරයෙකුව ආයාන්න තත්ත්වයේ සිට, පදනම් මිළක් ක්‍රියා කරවන්නෙකුගේ තත්වයකට පත්වීමෙන් වර්ෂය තුළ වී අලෙවි මණ්ඩලය මගින් කරගෙන ගිය කටයුතුවල ප්‍රධාන වෙනසක් ඇති විය. 1980 නොවැම්බර් මස වන තෙක්ම වී අලෙවි මණ්ඩලය මගින් දෙනු ලැබූ බුසලකට රු. 40 ක් වූ සහතික මිළ රු. 50 ක් ලෙස ප්‍රතිශෝධනය කිරීමෙන් පසු එය වී සඳහා පදනම් මිළ බවට පත් විය. කෙසේ වුවද, වැඩි වෙමින් පවතින පරිභෝජනය හේතුවෙන් පුද්ගලික වෙළඳුන් විසින් ගොවීනට ඉහළ මිළ ගණන් දෙනු ලැබූ නිසා වී අලෙවි මණ්ඩලයේ මිලදී ගැනීම් විශේෂයෙන් වර්ෂයේ අග භාගයේදී සැළකිය

යුතු පරිදි අඩු විය. මේ නිසා 1980 අග භාගයේ වී අලෙවි මණ්ඩලය මගින් මිළදී ගත් වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,700 ක් පමණක් වූ අතර, එය ඉකුත් වසරේ අදාල කාලච්ඡේදයේදී වී අලෙවි මණ්ඩලය මගින් කරන ලද මිළදී ගැනීම් වලින් හුදෙක් සියයට 2 ක් පමණක් විය.

වී මිළදී ගැනීමේදී වී අලෙවි මණ්ඩලයට මුහුණ පෑමට සිදු වූ වැඩි වන අවහිරතා නිසා බලවත් ගැටළු මතු වී ඇත. මින් සමරහක් අහිතකර අන්දමේ ඒවා විය. නිදසුනක් වශයෙන් වී අලෙවි මණ්ඩලයේ ප්‍රාග්ධන තොගයේ ධාරිතා උපයෝජනය බෙහෙවින් අඩු වන බව පැහැදිලිව පෙනී යාම දැඩි අවධානයට ලක් විය යුතු කරුණකි. 1980 දී වී අලෙවි මණ්ඩලයේ සහල් මෝල් ක්‍රියාත්මක වූයේ මාස කිපයක් තුළදී පමණි. ඉදිරි වර්ෂවලදී මෙම තත්වය තවත් අයහපත් වීමට බෙහෙවින් ඉඩ ඇත. ආහාර කොමසාරිස්ගේ ආරක්ෂණ තොග යෝජනා ක්‍රමයට සහභාගි වන්නකු වශයෙන් සමහර අවස්ථාවලදී ආහාර කොමසාරිස්ට ප්‍රමාණවත් පරිදි සහල් සැපයුම පිළිබඳ ගැටළු වලට වී අලෙවි මණ්ඩලයට මුහුණ පෑමට සිදු විය. මේ හැරුණු කල වෙන යම් යෝග්‍ය ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමෙන් හෝ ගොවිපලෙහිදීම මිළදී ගැනීම මගින් හෝ වී අලෙවි මණ්ඩලයේ වී මිළදී ගැනීම් වැඩි නොවුනහොත්, දැනට කරනු ලබන වී මිළදී ගැනීම් ඒ මට්ටමේම පවතී නම් එහි අලෙවි සැල් මගින් විවෘත වෙළඳපලට සපයනු ලබන සහල් ප්‍රමාණය අනාගතයේදී බෙහෙවින් සීමා වීමට ඉඩ ඇත.

මහව පිහිටුවන ලද පොහොර මිශ්‍රණ හා බෙදා හැරීම් සංකීර්ණයෙහි නිෂ්පාදන කටයුතු නිසා දිවයිනේ කිහිප පළාතකම පොහොර බෙදා හැරීමේ කටයුතුවලද දියුණුවක් දක්නට ලැබිණි. මෙම සංකීර්ණයට ටොන් 16,000 ක පොහොර ගබඩා කිරීමේ සහ වැඩ කරන පැයකදී ටොන් 10 ක් මිශ්‍ර කිරීමේ ධාරිතාවක් ඇත. 1979 දී නිකුත් කරන ලද ටොන් 16,000 හා සමග සසඳා බලන කල 1980 දී මෙම සංකීර්ණය මගින් පොහොර ටොන් 45,000ක් නිකුත් කර ඇත.

ඉඩම් ප්‍රතිසංස්කරණය යටතේ තමන්ට අහිමි වූ ඉඩම් සම්බන්ධයෙන් වන්දි ඉල්වා කලින් ඉඩම් හිමියන් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිබඳව විමසා බැලීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් තව දුරටත් කරගෙන යන ලදී. 1980 දී හෙක්ටයාර 4,134 ක් (අක්කර 10,211 ක්) කලින් ඉඩම් හිමියන් වෙත ආපසු භාර දෙන ලදී. මේ අනුව වර්ෂය අවසානයේදී එසේ ආපසු දුන් මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 9,662 ක් (අක්කර 23,864) නැතහොත් 1972 දී පවරාගත් මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 4·4 ක් විය.

1972 දී ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ කලින් ඉඩම් හිමියනට රුපියල් දශ ලක්ෂ 34·2 ක් ගෙවනු ලැබූ අතර මෙම නීතිය යටතේ මේ දක්වා ගෙවන ලද මුළු වන්දි ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 273·2 ක් විය. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් 1975 සංශෝධන කොන්දේසි යටතේ 1980 දී රුපියල් දශ ලක්ෂ 69·3 ක මුළු වන්දි ප්‍රමාණයක් ගෙවා ඇත. මෙම මුදලින් රුපියල් දශ ලක්ෂ 62·3 ක්ම ගෙවන ලද්දේ රන් පවුම් සමාගම් 61 ක් වෙතටය. 1980 අවසන් වන විට පොදු සමාගම් වලට ගෙවනු ලැබූ වන්දි මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 233 ක් විය.

1979 අංක 43 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ, පුද්ගලයින් වෙත ඉඩම් නැවත බෙදා දීම 1980 වර්ෂයේදී තවදුරටත් ක්‍රියාත්මක විය. වර්ෂය තුළදී හෙක්ටයාර 3,581 ක මුළු බිම් ප්‍රමාණයක් පුද්ගලයින් වෙත නැවත බෙදා දෙන ලදී. නැවත බෙදා දෙන ලද ඉඩම් වල ආර්ථික වශයෙන් ප්‍රයෝජන ගැනීම රඳා පවතිනුයේ, ව්‍යාප්ති සහ අලෙවි පහසුකම් වැනි උපයෝගී සේවාවන් නිසි කලට, ප්‍රමාණවත් ලෙස සැළසීම මත බැවින්, ඒ සම්බන්ධයෙන් ඉටු කළ යුතු වැඩ කටයුතු රැසක් ඇති බව මෙහි ලා අවධාරණයෙන් සඳහන් කිරීම අවශ්‍යය.

1979 වර්ෂයේ දී දක්නට ලැබුණු වගා කටයුතු සඳහා දෙනු ලබන මුළු ණය ප්‍රමාණයේ අඩුවීමේ උපනතිය 1980 දී ද තවදුරටත් එලෙසම නොවෙනස්ව පැවතිණ. 1980 දී දෙන ලද මුළු ග්‍රාමීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 101·9 ක් වූ අතර, එය 1979 වර්ෂයේ දී දෙන ලද ණය ප්‍රමාණයට වඩා සියයට 4 කින් අඩු විය. වගා ණය සම්බන්ධයෙන් බලන කල, 1980

වර්ෂයේ දෙන ලද වගා ණය ප්‍රමාණය, සපිරි ග්‍රාමීය ණය ක්‍රමය ඇරඹූ, 1973 වර්ෂයේ සිට දෙන ලද ණය ප්‍රමාණයේ සාමාන්‍ය ගණනට වඩා සියයට 41 කින් අඩු විය. 1979 වාර්ෂික වාර්තාවෙන්ද පෙන්වා දුන් පරිදි, ග්‍රාමීය ණය ප්‍රමාණයෙහි මෙම කැපී පෙනෙන අඩුවීමට හේතුව සහ කරුණු පැහැදිලි කිරීම වශයෙන් දක්විය හැක්කේ, රජය වෙනුවෙන් මහ බැංකුව ක්‍රියාත්මක කළ සියයට 75 ක ණය ඇපවීම ඉවත් කර ගැනීමය.

රජයේ අනුග්‍රහය ලද නැවත වගා කිරීමේ ආධාර ක්‍රම සඳහා 1980 වර්ෂයේ දක්වුන අනුකූලතාවය සතුටුදායක විය. පොල් වගා අංශයේ නැවත වගා කිරීම් සහ අළුතින් වගා කිරීම් ඉකුත් වසරේ මට්ටම්වලට වඩා සැළකිය යුතු දියුණුවක් පෙන් වූ අතර, මෙම වැඩි වීම් පිළිවෙලින් සියයට 59 ක් සහ සියයට 80 ක් විය. රබර් නැවත වගා කළ බිම් ප්‍රමාණය සියයට 30 කින් වැඩි විය. එසේ වුව ද, නැවත වගා කළ බිම් ප්‍රමාණය, පරණ රබර් ගස් වෙනුවට නැවත වගා කිරීම සහ අතපසු වූ නැවත වගා කිරීමේ කටයුතු වලට සරිලන පරිදි කළ යුතු වූ අපේක්ෂිත නැවත වගා කිරීම් ඉලක්කයට වඩා බෙහෙවින් අඩු විය. පසුගිය වසර කිහිපය තුළදී දුර්වල ව ක්‍රියාත්මක වූ තේ නැවත වගා කිරීමේ වැඩ පිළිවෙල 1980 වර්ෂයේ දී තව දුරටත් පිරිහී ඇති බැව් වාර්තා විය. 1979 වර්ෂයේදී තේ නැවත වගා කළ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,491 ක් වූ අතර, 1980 දී නැවත වගා කළ බිම් ප්‍රමාණය ඊට සුළු වශයෙන් අඩුව හෙක්ටයාර 2,078 ක් විය. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා වතුවල නැවත වගා කිරීම කෙරෙහි දක්වූ උදසීන බව වඩාත් ඉස්මතුවී පෙණින.

1979 අයවැයෙන් ප්‍රකාශයට පත් කැරුණු, නැවත වගා කිරීමේ සහනාධාර අනුපාතිකයන් වැඩි කිරීම, කුඩා වතු හිමියන් ප්‍රධාන තැනක් ගත්නා පොල් සහ රබර් අනු අංශයන්හි නැවත වගා කිරීමේ කටයුතු වැඩි කරලීම කෙරෙහි අපේක්ෂිත අයුරින් බලපෑ බව පෙනේ. රාජ්‍ය අංශයේ වතු සම්බන්ධයෙන් බලන කල, රබර් නැවත වගා කිරීමේ කටයුතු වල සැළකිය යුතු දියුණුවක් දක්නට ඇති නමුදු, නැවත වගා කල තේ බිම් ප්‍රමාණය සියයට 21 කින් අඩු වී ඇත. මීට කලින් වාර්ෂික වාර්තාවල ද නිරතුරුවම සඳහන් කළ පරිදි, නැවත වගා කිරීමේ සහනාධාරයන් නිතර සමාලෝචනයට භාජනය කිරීමත් ප්‍රතිශෝධනය කිරීමත් අවශ්‍ය වේ.

අතුරු ආහාර භෝග සඳහා වූ "පදනම් මිළ ක්‍රමය" 1980 දී ද තව දුරටත් ක්‍රියාත්මක විය. මෙම මිළ ගණන් වර්ෂය තුළදී වැඩි කරනු ලැබීය. කව්පි, මුං ඇට සහ අර්තාපල් ද ඇතුළත් වන පරිදි, මෙම ක්‍රමය යටතට ගැණෙන භෝග සංඛ්‍යාව 12 දක්වා වැඩි කරන ලදී. මෙම ක්‍රමය යටතේ කළ මිළදී ගැනීම් ප්‍රමාණය සුළු වුවද, දෙන ලද පදනම් මිළෙහි සහ අලෙවි මධ්‍යස්ථාන වැඩිවීමෙහි ප්‍රතිපලයක් වශයෙන් විශේෂයෙන්ම, රටකජු, කව්පි, මුංඇට සහ අර්තාපල් වැනි ඇතැම් භෝගවල නිෂ්පාදනය බෙහෙවින් වැඩි වූවා විය හැකිය.

1980 වර්ෂයේ දෙවන භාගයේ දී එළවළු සහ අතුරු ආහාර භෝග නිෂ්පාදනයේ සැළකිය යුතු වැඩිවීම් දක්නට ලැබුණි. දිවයිනේ මෙම භෝග වගා කෙරෙන ප්‍රධාන ප්‍රදේශවල, ඇතැම් භෝග සඳහා ගොවිපළෙහි දී ගෙවනු ලබන මිළ ගණන් බෙහෙවින් පහත වැටීම නිසා එම භෝග දිගටම වගා කරගෙන යාම ලාභ දයී නොවේ. එළවළු සඳහා ප්‍රමාණවත් අළෙවි පහසුකම් නොමැති බවට ද සාධක ඇත. ගොවිපළ වලදී ගෙවනු ලබන මිළ ගණන් අඩු වුවද නාගරික ප්‍රදේශයන්හි පාරිභෝගිකයන්ට මෙම භෝග මිළදී ගැනීමට සිදු වූයේ සාපේක්ෂ වශයෙන් වැඩි මිළ ගණන් වලටය. දිවයිනේ ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගනු ලබන ලොරි ප්‍රමාණය සැළකිය යුතු ලෙස වැඩි වුවද, ගබඩා පහසුකම් සහ අලෙවි පහසුකම් ප්‍රමාණවත් නොවන බවට ද සාක්ෂි ඇත. මෙම අංශය කාර්‍යක්ෂම ලෙස සංවිධානය කර ගත්තේ නම්, සැපයුම වැඩි කර ගැනීම සහ එමගින් ගෙදර දෙර වියදම් වලට ඇතුළු වන ද්‍රව්‍යයන්, සම්බන්ධයෙන්වත් ජීවන වියදම් පහත හෙලීම සඳහා දරනු ලබන උත්සාහයේදී සැලකිය යුතු සහනයක්, 1980 වර්ෂය තුළදී ලබා ගත හැකිව තිබුණි. මෙම වර්ෂය තුළදී නිෂ්පාදක හා පාරිභෝගික දෙපක්ෂයටම බෙහෙවින් අපේක්ෂා කෙරෙන සහනයන් ලබා දීමට මෙම අංශයේ කටයුතු වල නියුතු රාජ්‍ය ව්‍යවසායක ආයතන පවා අසමත් වූ අවස්ථා එමටය.

රටේ ප්‍රධාන සංවර්ධන යෝජනා ක්‍රමය වන කඩිනම් මහවැලි වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 1980 වර්ෂය තුළදී සෑහෙන ප්‍රගතියක් දක්නට ලැබුණි. මෙම වැඩ පිළිවෙල වෙනුවෙන් වැය කොට ඇති රුපියල් දශ ලක්ෂ 3,436 ක් වන මුළු මුදලින් සියයට 77 ක් පමණ වැය කොට ඇත්තේ 1980 වර්ෂය තුළදීය.

### 1 · 8 සංඛ්‍යා සටහන

### කඩිනම් මහවැලි වැඩ පිළිවෙල – ගණන් බලන ලද වියදම

රුපියල් දශ ලක්ෂ

| යෝජනා ක්‍රමය | 1980 සඳහා වෙන් කළ වියදම | | | 1980 නියම වියදම(අ) | 1980 අවසන් වන විට මුළු වියදම(අ) |
|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | පරිපූරක | එකතුව | | |
| 1. වික්ටෝරියා ජලාශය .. | 500 | 685 | 1,185 | 901 | 999 |
| 2. කොත්මලේ ජලාශය .. | 500 | 145 | 645 | 862 | 1,145 |
| 3. රන්දෙනිගල ජලාශය .. | 10 | 33 | 43 | 30 | 55 |
| 4. මාදුරුඔය ජලාශය සහ උමග .. | 300 | 274 | 574 | 383 | 482 |
| 5. උල්හිටිය ජලාශය, මිනිපේ අමුණ, ද්‍රෝණිය හරහා ඉදිකෙරෙන ඇල ආදිය ('සී' කලාපයේ ඉන්ජිනේරු කටයුතු ඇතුළුව) .. | 75 | 70 | 145 | 145 | 284 |
| 6. 'ඒ' වාරිමාර්ග කලාපය .. | 10 | — | 10 | 3 | 6 |
| 7. 'බී' වාරිමාර්ග කලාපය .. | 75 | 65 | 140 | 99 | 117 |
| 8. 'සී' වාරිමාර්ග කලාපය .. | 75 | 50 | 125 | 240 | 345 |
| 9. 'ඩී' වාරිමාර්ග කලාපය .. | 1 | — | 1 | 1 | 3 |
| එකතුව .. | 1,546 | 1,322 | 2,868 | 2,664 | 3,436 |

(අ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

වික්ටෝරියා යෝජනා ක්‍රමයේ වේලි, උමං සහ බලාගාර තැනීම සහ උපකරණ සැපයීම සඳහා වන ගිවිසුම් වලට එළඹ ඇත. ලැබී ඇති තොරතුරු අනුව, මෙම යෝජනා ක්‍රමය සඳහා මෙතෙක් වැය කර ඇති රුපියල් දශලක්ෂ 1,000 ක් පමණ වන මුළු වියදමින් රුපියල් දශලක්ෂ 900 ක් පමණ වැය කර ඇත්තේ 1980 වර්ෂය තුළදීය. 1984 වර්ෂයේ මැද වන විට, මෙම යෝජනා ක්‍රමය නිම කොට බලාගාරයේ වැඩ කටයුතු ඇරඹීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොත්මලේ යෝජනා ක්‍රමයේ මූලික වැඩ බිම් කටයුතු සහ භූගත උමං තැනීමේ කටයුතු අරඹා ඇත. එහෙත් වේල්ල ඉදි කිරීමේ ගිවිසුම් වලට තවමත් එළඹ නැත. 1980 වර්ෂය අවසාන වන විට, කොත්මලේ යෝජනා ක්‍රමය වෙනුවෙන් වැය කළ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 1,145 ක් වූ අතර, එයින් රුපියල් දශලක්ෂ 862 ක් පමණ වැය කර ඇත්තේ 1980 වර්ෂය තුළදීය. මාදුරු ඔය යෝජනා ක්‍රමයේ ද ජලාශය සහ උමග ඉදි කිරීමේ ගිවිසුම් වලට එළඹ ඇත. මාදුරු ඔය යෝජනා ක්‍රමය වෙනුවෙන් වැය කර ඇති රුපියල් දශලක්ෂ 482 ක් වන මුළු මුදලින්, රුපියල් දශ ලක්ෂ 383 ක් 1980 වර්ෂය තුළදී වැය කර ඇත.

මහවැලි ප්‍රදේශයේ පහළ වාරිමාර්ග කළාපයන්හි සංවර්ධන කටයුතු වල සැළකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. හෙක්ටයාර 24,291 ක බිම් ප්‍රමාණයක් සංවර්ධනය කෙරෙන 'සී' කලාපය වෙනුවෙන් 1980 වසර තුළ දී දළ වශයෙන් රුපියල් දශලක්ෂ 240 ක් වැය කර ඇත. හෙක්ටයාර 48,583 ක බිම් ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන 'බී' කලාපය වෙනුවෙන්, 1980 දී රුපියල් දශලක්ෂ 99 ක මුදලක් වැය කර ඇත.

1980 වර්ෂය තුළදී, කලාවැව ප්‍රදේශයේ ('එච්' කලාපය) පවුල් 6,700 ක් පමණ පදිංචි කරවනු ලැබීය. 1980 වර්ෂය අවසානය වන විට මෙසේ පදිංචි කරවනු ලැබූ මුළු පවුල් සංඛ්‍යාව 20,000 ක් පමණ වූ අතර, එක් පවුලකට, වගා කටයුතු සඳහා හෙක්ටයාර එකක් බැගින් ද, ගෙවතු සහ නිවාස සඳහා හෙක්ටයාර 1/5 ක් බැගින් ද වෙන් කර දෙන ලදී. උල්හිටිය ප්‍රදේශයේ ('සී' කලාපය) ජනාවාස සංවර්ධනයේ මූලික වැඩ කටයුතු වලට සහභාගි කරවා ගනු පිණිස, අපේක්ෂිත පදිංචි කරුවන් 1,000 කට වැඩි ප්‍රමාණයක ගේ නම්, ලැයිස්තු ගත කර ඇත.

'එච්' කලාපයේ හෙක්ටයාර 15,000 ක පමණ බිම් ප්‍රමාණයක් 1980 වර්ෂය තුළදී වගා කරනු ලැබූ අතර, ඉන් හෙක්ටයාර 13,500 ක පමණ වී වගා කොට ඇත.

වාරිමාර්ග, ක්ෂේත්‍ර භෝග, ග්‍රාමීය ණය, සත්ව පාලනය, භූගත ජලය ලබා ගැනීම, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ග්‍රාමීය පෙදෙස්වලට විදුලි බලය සැපයීම වැනි ග්‍රාමීය අංශයේ කටයුතු රාශියක් සංවර්ධනය කිරීම සඳහා සහාය වීමට අරමුණු කරගත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සංකල්පය යටතේ දිස්ත්‍රික් යෝජනා ක්‍රම රැසක් 1980 වර්ෂය තුළදී සලකා බලනු ලැබීය, ලෝක බැංකුවේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය II යටතේ, 1981 වර්ෂය තුළදී. දළ වශයෙන් රුපියල් දශලක්ෂ 780 ක වියදමින් පුත්තලම සහ මාතලේ යන දිස්ත්‍රික්ක සංවර්ධනය කෙරෙනු ඇත. ලෝක බැංකුවේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම III යටතට ගැණෙන මන්නාරම සහ වවුනියා යන දිස්ත්‍රික්ක සඳහා වූ යෝජනා ක්‍රම තවම මූලික සැකසුම් අවස්ථාවේ .ඇත. නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි තෝරා ගැණෙන වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ඇතැම් යෝජනා ක්‍රම සඳහා මුදල් යෙදවීමට නෙදර්ලන්ත රජය කැමැත්ත පලකර ඇත. එසේම, මොණරාගල දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා මුදල් යෙදවීමට බෙල්ජියන් රජය කැමැත්ත පළකර ඇති අතර, රුපියල් දශලක්ෂ 130 ක් පමණ වෙතැයි ගණන් බලා ඇති වියදමකින්, වේලි ඉදි කිරීම, වාරිමාර්ග සහ ජනාවාස පහසුකම් සැළසීම සඳහා මාගන්දන ඔය යෝජනා ක්‍රමය අත්හද බැලීමක් වශයෙන් තෝරාගෙන ඇත.

රුපියල් දශලක්ෂ 335 ක් පමණ වෙතැයි ගණන් බලා ඇති වියදමකින්, නෝර්වීජියානු රජය විසින් මුදල් යොදවා කරනු ලබන හම්බන්තොට යෝජනා ක්‍රමය සහ රුපියල් දශලක්ෂ 55 ක ස්වීඩන රජයේ ප්‍රදානයක් මගින් මුදල් යොදවනු ලබන මාතර යෝජනා ක්‍රමය, මූලික වැඩ කටයුතු අරඹා, සැහෙන ප්‍රගතියක් පෙන්නුම් කල තවත් ඒකාබද්ධ සංවර්ධන යෝජනා ක්‍රම දෙකකි.

1979 වාර්ෂික වාර්තාවෙහි ද පෙන්වා දුන් පරිදි, අරමුදල් නොමැති වීම මෙන්ම, රජයේ ඒ ඒ ආයතන අතර වගකීම බෙදී යාම නිසා සුළු වාරිමාර්ග යෝජනාක්‍රම නොසළකා හැර ඇත. 1980 වර්ෂය තුළදී ද මෙම තත්ත්වයේ වෙනසක් සිදු වී නැත. කෙටිකාලයක් තුළදී කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කර ගත හැකි ඉක්මන් වූත්, ලාභදායී වූත් එක් මාර්ගයක් වනුයේ, වැඩි ප්‍රමුඛත්වයක් ලැබීමේ පදනම මත සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම සහ මැනවින් නඩත්තු කිරීම සහ සම්පත් වැඩියෙන් වෙන් කිරීම බව මෙහි ලා සඳහන් කිරීම වටී. එවැනි ක්‍රියාවලියක් මගින්, විශාල සහ සුළු වාරිමාර්ග ක්‍රම අතර සම්පත් වෙන් කිරීමේදී ඇතිවී තිබෙන අසමතුලිත තාවය ද මග හැරෙනු ඇත.

තේ

සියයට 7 කින් පහත වැටී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 191 ක්ව ඇතැයි ගණන් බලා ඇති, 1980 වර්ෂයේ තේ නිෂ්පාදනය, 1959 න් පසු වාර්තා වූ පහත්ම නිෂ්පාදන මට්ටම විය. උස්, මැදි හා පහත් යන සියළුම බිම් මට්ටම්වල නිෂ්පාදනය පහත වැටුණු අතර, එය වඩාත් කැපී පෙනුනේ සියයට 11 කින් නිෂ්පාදනය අඩු වූ මැදි බිම් ප්‍රදේශවලය. උස් හා පහත් බිම් ප්‍රදේශවල තේ නිෂ්පාදනය පිළිවෙලින් සියයට 5 කින් හා 6 කින් පහත වැටුණි. දිවයිනේ ලියා පදිංචි කර ඇති මුළු තේ ඉඩම් වලින් සියයට 53 ක් පමණ අයත් වන පොදු අංශයේ විශාල සංස්ථාවන් වන ජනතා වතු සංවර්ධන මණ්ඩල හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා විසින් මුළු නිෂ්පාදන යෙන් සියයට 68 ක් නැතහොත් නිමි තේ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 130 ක් නිපදවනු ලැබීය.

LIBRARY SRI LANKA



කෙසේ වුවද, මෙම සංස්ථාවන්හි කම්හල් මගින් මිලදී ගත් අමු තේ දළු සකස් කිරීමෙන් නිෂ්පාදනය කරන ලද නිමි තේ කිලෝග්‍රෑම් දශ ලක්‍ෂ 25 ද ගණන් ගනු ලැබුවහොත්, ඒවායේ මුළු නිමි තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් දශ ලක්‍ෂ 155ක් නැතහොත් මුළු නිෂ්පාදනයෙන් සියයට 81ක් වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කර ඇති සංඛ්‍යාලේඛන අනුව, 1980 වර්ෂයේ පොදු අංශයේ සංස්ථාවල තේ නිෂ්පාදනය ඉකුත් වසර හා සසඳා බලන කල සියයට 7·4කින් අඩුව ඇති අතර, පුද්ගලික අංශයේ තේ නිෂ්පාදනය සියයට 1·2කින් පහත වැටී ඇත.

තේ වගා අනු අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණය තව දුරටත් පහත වැටුණු අතර, මෙම වර්ෂයේ එය ඉකුත් වසරට වඩා සියයට 3·5 කින් අඩුවිය. ජනතා වතු සංවර්ධන මණ්ඩල වල හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවල පොහොර භාවිතය, 1979 දී සුළු වශයෙන් වැඩි වූ නමුත්, මෙම වර්ෂයේ ඒවායේ පොහොර භාවිතය සියයට 12 කින් පමණ අඩුවී යැයි වාර්තා වී ඇත. පොහොර භාවිතය පහත් මට්ටමක පැවතීමට බලපෑ ප්‍රධාන සාධකයක් වූයේ 1980 වර්ෂයේ මුල් භාගයේ පැවති දැඩි වියළි කාලගුණික තත්ත්වයන්ය. මෙම අහිතකර තත්ත්වයන් හෙක්ටයාරයක ඵලදාව මෙන්ම මුළු නිෂ්පාදනය කෙරෙහිද බලපෑවේය.

**1 · 9 සංඛ්‍යා සටහන**

**තේ සංඛ්‍යා 1978–1980**

| ශීර්ෂය | ඒකකය | 1978 | 1979 | 1980(අ) |
|---|---|---|---|---|
| 1· නිෂ්පාදනය | කි·ග්‍රෑ· දශ ලක්ෂ | 198·9 | 206·4 | 191·4 |
| 1·1 උස් බිම් | ,, | 71·7 | 76·5 | 72·6 |
| 1·2 මැදි බිම් | ,, | 61·0 | 62·5 | 55·6 |
| 1·3 පහත් බිම් | ,, | 66·2 | 67·4 | 63·2 |
| 2· වගා කළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් වලින් | 243 | 244 | 245 |
| 3· පලදාව | හෙක්ටයාරයට / කි·ග්‍රෑ· | 958 | 993 | 922 |
| 4· පොහොර නිකුතුව | මෙට්‍රික් ටොන් දහස් වලින් | 115·6 | 105·4 | 101·7 |
| 5· නැවත වගා කිරීම (ආ) | හෙක්ටයාර | 1,709 | 2,491 | 2,078 |
| 6· මිළ | | | | |
| 6·1 කොළඹ (ශුද්ධ) | කි·ග්‍රෑ· / රුපියල් | 11·65 | 11·22 | 17·33 |
| 6·2 අපනයන (නැ·වි·ස·) | ,, | 33·22 | 30·51 | 33·41 |
| 7 නිෂ්පාදන වියදම | ,, | 10·50 | 12·70 | 15·50 |
| 8· අපනයන | කි·ග්‍රෑ· දශ ලක්ෂ | 192·7 | 187·5 | 184·7 |
| 9· අපනයන ඉපැයුම් | රුපියල් දශ ලක්ෂ | 6,400·9 | 5,722·2 | 6,170·1 |
| | (විගැහි දශ ලක්ෂ) | (327) | (284) | (287) |
| 10. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඇ) | | 10·9 | 7·9 | 6·3 |

(අ) තාවකාලික.
(ආ) සංශෝධිත.
(ඇ) වගා කිරීමේ සහ සැකසුම් කටයුතු පමණක්.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1980 වර්ෂයේ තේ වගාව යටතේ පැවති ලියා පදිංචි කරන ලද බිම් ප්‍රමාණය බොහෝ දුරට ඉකුත් වසරෙහි පැවති මට්ටමට සමාන විය. තේ නැවත වගා කිරීම සඳහා වූ රජයේ සහනාධාරය වැඩි වශයෙන් පහත් බිම් සඳහා අක්කරයකට රු. 8,000 ක් වශයෙන්ද (හෙක්ටයාරයකට රු. 19,760), උස් හා මැදි බිම් ප්‍රදේශ සඳහා අක්කරයකට රු. 10,000 ක් වශයෙන්ද (හෙක්ටයාරයකට රු. 24,700) නොවෙනස්ව පැවතුනි. ඉකුත් වසරේ අක්කරයකට රු. 4,750 දක්වා (හෙක්ටයාරයකට රු. 11,733) වැඩි කළ පැරණි රබර් ඉඩම්වල සහ අළුත් ඉඩම්වල රිකිලි තේ වගා කිරීම සඳහා වූ සහනාධාරය මෙම වර්ෂයේද එලෙසම පැවතුනි. ලැබී ඇති සංඛ්‍යා ලේඛන අනුව නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය 1979 වූ හෙක්ටයාර 2,491 සිට 1980 දී හෙක්ටයාර 2,078 දක්වා හෙක්ටයාර 413 කින් අඩු වී ඇත. මෙම අඩු වීමෙන් සියයට 92 ක්ම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුවල විය. කෙසේ වුවද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් 1980 දී නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය තවමත් ඉකුත් වසරේ මෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩල විසින් නැවත වගා කරන ලද බිම් ප්‍රමාණයට වඩා වැඩි බව මෙහිලා අවධාරණයෙන් දැක්විය යුතුය.

34802

අයහපත් කාලගුණික තත්ත්වයට අමතරව, ඉහළ නැගෙමින් පැවති නැවත වගා කිරීම සඳහා වූ වියදම් මෙන්ම, මෙම සංස්ථාවලට මුහුණ පෑමට සිදු වූ මුදල් අපහසුකම් ද, යන කරුණු එකතුවී මෙසේ නැවත වගාකිරීම සමස්ථ වශයෙන් පහත් මට්ටමක පැවතීම කෙරෙහි බලපා ඇත. 1980 අවසන්වන විට රිකිලි තේ මගින් නැවත වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 36,139 ක් වූ අතර, එය ලියා පදිංචි කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 15 ක් පමණ විය.

1980 දී තේ මිල ගණන් යහපත්ව පැවතුණි. වැඩි වශයෙන්ම 1979 වර්ෂය මැද භාගයේ අඩු කරන ලද අය බදු නිසා කොළඹ සාමාන්‍ය ශුද්ධ (බදු අය කිරීමෙන් පසු) වෙන්දේසි මිළ ගණන් ඉකුත් වසරට වඩා සියයට 55 කින් පමණ සැලකිය යුතු පරිදි වැඩි විය. කෙසේ වුවද, සාමාන්‍ය අපනයන (නැ වි.ස.) මිළ ගණන් වැඩි වූයේ සියයට 10 කින් පමණි. තේ නිෂ්පාදන රටවල් ලෝක වෙළඳපලට සපයනු ලැබූ තේ ප්‍රමාණය අඩු වීම, මිළ ගණන් ඉහළ යාමට බලපෑ ප්‍රධාන හේතුව වන්නට ඇත. තේ කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කිරීම සඳහා වූ වියදම සියයට 22 කින් වැඩි වී යැයි ගණන් බලා ඇත. මෙම වැඩිවීම් වලින් වැඩි කොටසක් වැය වූයේ තේ පෙට්ටි, ප්‍රවාහන කටයුතු සහ ඉන්ධන සඳහාය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අනුව, තේ කර්මාන්තය සමස්ථයක් වශයෙන් ගෙන සලකා බලන කළ, ඉකුත් වසරේ මෙන් පාඩු නොලබා ලාභ ලබා ගැනීමට පොහොසත් විය. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා සහ ජනතා වතු සංවර්ධන මණ්ඩල විසින් නිෂ්පාදනය කරන ලද සෑම නිමි තේ කිලෝග්‍රෑම් එකක් සඳහාම පිළිවෙලින් රු. 1·42 ක් සහ ශත 95 බැගින් ලාබ ලැබී ඇත.

තේ පරිභෝජනය කරනු ලබන විදේශ රටවල තේ මලු හා පැකට් කරන ලද තේ සඳහා ඉහළ නැගෙමින් පවතින ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, රජය විසින් එම තේ අපනයනයන් දිරි ගැන්වීම සඳහා ඒවායේ අපනයන බදු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කරන ලදී. පැකට් කරන ලද තේ මෙන්ම තේ මළු සඳහා රු. 10·50 ක් පැවති අපනයන බදු 1980 ජූලි මස පළවෙනි දින සිට බලපැවැත්වෙන පරිදි, පිළිවෙලින් රු. 1·00 සහ රු 8.50 දක්වා අඩු කළේය. ඉන්ධන, තේ පෙට්ටි, විදුලි බලය ආදිය සඳහා වැඩිවන පිරිවැය වලට නිෂ්පාදකයනට මුහුණ දීමට හැකි වන පරිදි ' මිළ පිහිටාධාර ක්‍රමය ' යටතේ තේ කම්හල් විසින් නිෂ්පාදන වියදම් වශයෙන් අඩු කර ගනු ලබන කිලෝග්‍රෑම් එකක් සඳහා රු. 4·70 ක්වූ මුදල, 1980 ඔක්තෝබර් මස පළමු වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, රු. 5·40 දක්වා වැඩි කරන ලදී. වෙන්දේසි මිල ගණන් ඉහළ යාමේ උපනතිය හා තේවල තත්වය උසස් කිරීමට ඇති අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, මෙම ක්‍රමය යටතේ සහනාධාර ලැබීම සඳහා සුදුසුකම් ලබන පදනම් මිල කිලෝග්‍රෑම් එකකට රු. 11·00 සිට රු. 12·00 දක්වා වැඩි කරනු ලැබීය මෙම වර්ෂය තුළදී අනුගමනය කරන ලද තවත් වැදගත් ප්‍රතිපත්තිමය පියවරක් වූයේ තේ මිශ්‍රණ කර්මාන්තය සඳහා ඇල්මක් දක්වන ආයෝජකයනට ඒ සඳහා ඉඩ හැරීමය. මෙබඳු පියවර අපනයන විවිධාංගකරණය සඳහා උපකාරී වනු ඇත.

රබර්

කිලෝග්‍රෑම් දශ ලක්ෂ 133 ක් ලෙස තාවකාලිකව ගණන් බලා ඇති 1980 වර්ෂයේ රබර් නිෂ්පාදනය, ඉකුත් වසරේ නිෂ්පාදනය හා සසඳන කළ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 20 ක හෙවත් සියයට 13 ක අඩු වීමක් දැක්විය. නිෂ්පාදනයේ මෙම අඩු වීමට මූලික වශයෙන් හේතු වූයේ, වැඩි වශයෙන්ම පරණ රබර් ගස් ප්‍රමාණය සීඝ්‍රයෙන් වැඩි වීමෙන් එලදාව පහත වැටීමේ උපනතියක් ඇති වීමය. පසුගිය කාලය තුළ රබර් නැවත වගා කිරීමේ මට්ටම පහත වැටීම මෙසේ පරණ රබර් ගස් අධික වීමට තරමක් දුරට හේතු වී ඇත. මෑත වර්ෂවල රබර් නැවත වගා කිරීම වැඩි වීමේ හේතුවෙන් කිරි කැපිය හැකි රබර් ඉඩම් ප්‍රමාණය අඩු වීමද නිෂ්පාදනයේ අඩු වීමට එක් හේතුවක් වූවා විය හැක. පොදු රාජ්‍ය මණ්ඩලීය සංවර්ධන ආයතනය පිළියෙල කළ රබර් පිළිබඳ මහා සැලැස්මට අනුව, වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 25 ක පමණ එල දරණ කාලසීමාව අවුරුදු හතරට වඩා අඩුය. මෙම බැරෑරුම් තත්වයෙන් පැහැදිලි වන්නේ මෙම අංශය පුනරුත්ථාපනය සඳහා ඉතාමත් දැඩි වැඩපිළිවෙලක් වහා ක්‍රියාත්මක

කිරීමේ අවශ්‍යතාවයි. පසුගිය කාලය තුළ පැවති ඉහළ මිලයන්ගේ වාසිය ලබා ගැනීම පිණිස කුඩා වතු හිමියන් විසින් වැඩිපුර කිරි ලබා ගැනීම සඳහා අනුගමනය කරන ලද කිරි කැපීමේ පිළිවෙත්ද, එම අංශයේ සාමාන්‍ය පලදාවේ වත්මන් අඩු වීමට හේතු වන්නට ඇත.

**1 · 10 සංඛ්‍යා සටහන**

**රබර් සංඛ්‍යා 1978 – 1980.**

| ශීර්ෂය | ඒකකය | 1978 | 1979 | 1980(අ) |
|---|---|---|---|---|
| 1· නිෂ්පාදනය | කි·ග්‍රෑ· දශ ලක්ෂ | 156 | 153 | 133 |
| 2· බිම් ප්‍රමාණය | | | | |
| 2·1 වගාව යටතේ ඇති | හෙක්ටයාර දහස් | 226·4 | 226·4 | 227·4 |
| 2·2 කිරි කැපීම යටතේ ඇති | ,, | 184·8 | 186·6 | 185·7 |
| 3· පලදාව | හෙක්ටයාරයකට/කි· ග්‍රෑ· | 845 | 820 | 716 |
| 4· පොහොර නිකුතුව | මෙට්‍රික් ටොන් දහස් වලින් | 21·0 | 23·5 | 21·4 |
| 5· නැවත වගාකිරීම | හෙක්ටයාර | 3,226 | 4,168 | 5,436 |
| 6· සාමාන්‍ය මිළ | | | | |
| 6·1 අපනයන (නැ· වි·ස·) | කි· ග්‍රෑ/රුපියල් | 14·90 | 19·44 | 21·42 |
| 6·2 කොළඹ ආර්·ඇස්·ඇස්·1 | ,, | 6·92 | 9·15 | 10·62 |
| 7· නිෂ්පාදන වියදම | ,, | 4·85 | 6.86(ආ) | 8·20(ආ) |
| 8· අපනයන | කි· ග්‍රෑ· දශ ලක්ෂ | 138·0 | 128·2 | 120·9 |
| 9· දේශීය පරිභෝජනය | ,, | 9·1 | 10·6 | 14·9 |
| 10· අපනයන ඉපැයුම් | රුපියල් දශ ලක්ෂ<br>(විගැහි දශ ලක්ෂ) | 2,020·6<br>(103) | 2,491·6<br>(124) | 2,590·5<br>(120) |
| 11· දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඇ) | | 2·9 | 4·1 | 3·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික.
(ආ) රාජ්‍ය අංශයේ වතුවල, පෞද්ගලික අංශයේ වතුවල සහ කුඩා වතුවල බර තබන ලද සාමාන්‍ය නිෂ්පාදන වියදම.
(ඇ) වගා කිරීම් සහ සැකැසුම් කටයුතු පමණක්.

1980 දී රාජ්‍ය අංශයේ වතුවල රබර් නිෂ්පාදනයේ වැඩි වීමක් වාර්තා වී ඇත. ඉකුත් වසර හා සසඳන කළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා වතුවල නිෂ්පාදනය සියයට 10කින් පමණ වැඩි වූ අතර ජනතා වතු සංවර්ධන මණ්ඩල වතුවල නිෂ්පාදනය ආන්තික වැඩි වීමක් පෙන්විය. මුළු රබර් නිෂ්පාදනයේ රාජ්‍ය අංශයේ වතුවල නිෂ්පාදන කොටස 1979 දී සියයට 30 සිට 1980 දී සියයට 37 දක්වා වැඩි වූ අතර ජනතා වතු සංවර්ධන මණ්ඩල සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා යටතේ පාලනය වූ කිරි කැපෙන මුළු රබර් බිම් ප්‍රමාණය සියයට 25 ක් විය. මින් පැහැදිලි වන්නේ 1980 දී කුඩා වතු අංශයේ ක්‍රියාකාරිත්වය දුර්වල වූ බවය. අනෙකුත් වැවිලි භෝගයන්හි මෙන්ම, කුඩා රබර් වතු හිමියන්ගේද ආර්ථික ගැටළු එලෙසම පැවතිණි. ඉකුත් වසරේදී මෙන්ම, 1980 දීද රබර් නැවත වගා කිරීමේ මට්ටම නොකඩවා වැඩි විය. 1980 දී හෙක්ටයාර 5,436 ක බිම් ප්‍රමාණයක්, වැඩි දියුණු කළ වර්ගයන්ගෙන් නැවත වගා කරන ලද අතර, මෙය 1979 නැවත වගා කළ ප්‍රමාණයට වඩා සියයට 30 ක වැඩිවීමකි. 1976 අයවැයෙන් ප්‍රකාශයට පත් කරන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාරය වැඩි කිරීම නිසා නැවත වගා කිරීම දිරි ගැන්වුනු බැව් පෙනේ. ඉදිරි පස් වසර තුළදී ලෝක බැංකුවේ ආධාර ඇතිව කළුතර, කෑගල්ල හා රත්නපුරය යන දිස්ත්‍රික්කයන්හි ආසන්න වශයෙන් හෙක්ටයාර 18,000 ක් පමණ වන බිම් ප්‍රමාණයක් පුනරුත්ථාපනය කිරීමට තෝරාගෙන ඇති හෙයින් නැවත වගා කිරීමේ කටයුතුවල තවදුරටත් වැඩි වීමක් ඇති වේ යැයි සිතිය හැක. වැඩිවන අපනයන ලැබීම් අනුව සළකා බලන කළ නැවත වගා කිරීමේ බිම් ප්‍රමාණය වර්ෂයකට හෙක්ටයාර 6,000 7,000 දක්වා වැඩි කිරීමට නිරන්තරවම උත්සාහ ගනු ලැබීම අත්‍යවශ්‍යය. රබර් අංශයේ අනාගතය, පලදාව වැඩි කිරීමට සහ නිෂ්පාදන වියදම් අඩු කිරීමට ඇති හැකියාව මත රැඳී ඇති හෙයින්, පලදාව වැඩි රබර් වර්ග නැවත වගා කිරීම කෙරෙහි ඉහළ ප්‍රමුඛත්වයක් දිය යුතුව ඇත. නැවත වගා කිරීම සම්බන්ධයෙන් දැරීමට සිදුවන වත්මන් ඉහළ වියදම අනුව

බලන කල, රබර් නැවත වගා කිරීම සඳහා දෙනු ලබන, රාජ්‍ය අංශයේ වතුවලට අක්කරයකට රු. 5,000 ක (හෙක්ටයාරයකට රු. 12,350) සහ පෞද්ගලික අංශයේ වතු වලට හා කුඩා වතු වලට අක්කරයකට රු. 6,500 ක (හෙක්ටයාරයකට රු. 16,055 ක්) සහනාධාරය ප්‍රමාණවත් නොවන බව පෙනේ. මෙම වියදම අක්කරයකට රු. 10,000 ක් (හෙක්ටයාරයකට රු. 25,000 ක්) පමණ වේ යැයි ගණන් බලා ඇත. එබැවින් ප්‍රමාණවත් සහනාධාරයක් ගෙවීමට හැකි වනු පිණිස මෙම ප්‍රශ්නය දැඩි විමසිල්ලට භාජනය කිරීම නුවනට හුරු බැව් පෙනේ.

1979 නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වූ අක්කරයකට රු. 2,700 ක් (හෙක්ටයාරයකට රු. 6,670) වන රබර් අළුතින් වගා කිරීම සඳහා දෙනු ලබන සහනාධාරය 1980 වර්ෂය තුළදී ද, එලෙසම පැවතිණි. 1980 වර්ෂය තුල දී හෙක්ටයාර 977 ක බිම් ප්‍රමාණයක් අළුතින් වගා කරන ලද අතර, එය ඉකුත් වර්ෂයේ වගා කළ ප්‍රමාණයට වඩා සියයට 68 ක වැඩි වීමක් පෙන්වීය. දැනට රබර් අළුතින් වගා කිරීම සඳහා දෙනු ලබන සහනාධාරයෙන් පියවා ගත හැකි වනුයේ වගා කිරීමේ වියදම් වලින් අඩකටත් අඩු ප්‍රමාණයක් පමණක් බැවින්, එම සහනාධාරය ප්‍රමාණවත් නොවන බව පෙනේ.

රබර් නැවත වගා කිරීමේ සෙස් බදු අරමුදලේ ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම සඳහා රබර් නැවත වගා කිරීමේ සෙස් බද්ද, 1980 වර්ෂය තුළදී කිලෝ ග්‍රෑමයකට රු. 0·35 සිට රු. 0·50 දක්වා වැඩි කරනු ලැබීය. රබර් නැවත වගා කිරීමේ මට්ටම වැඩි කිරීමට ඉඩ සැළසෙන පරිදි, සහනාධාරය, තවදුරටත් වැඩි කිරීමට නම්, නිෂ්පාදකයනට ප්‍රමාණවත් ලාභයක් ලබා ගැනීමට හැකිවනු පිණිස බද්දෙහි අනුරූප වෙනසක් සහිතව නැවත වගා කිරීමේ සෙස් බද්ද තවත් වැඩි කළයුතු වනු ඇත.

සාමාන්‍ය පිරිවැය වැඩිවීම හේතුකොටගෙන ජනතා වතු සංවර්ධන මණ්ඩල සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවලට පාඩු දැරීමට සිදු වුවද, සමස්තයක් වශයෙන් ගෙන බලන කළ රබර් කර්මාන්තයට දිගටම ලාභ ලභාගැනීමට හැකි විය. විශේෂයෙන්ම, ලේටෙක්ස් ක්‍රේප් සඳහා පැවැති අඩු මිළ ගණන් ක්‍රේප් රබර් නිෂ්පාදනයේ නියැලි ප්‍රධාන වතුවලට අහිතකර අන්දමින් බලපෑවේය. ක්‍රේප් සහ ෂීට් රබර් වල මිලයන්හි වෙනස, ෂීට් රබර් නිෂ්පාදනයට හිතකර ලෙස වෙනස් වූ නිසා, එය ක්‍රේප් රබර් නිෂ්පාදනයේ සිට ෂීට් රබර් නිෂ්පාදනය කරා යොමු වීමකට පෙළඹවීමක් විය. රාජ්‍ය අංශයේ වතු වලින් සියයට 30 කට පමණ දෙවර්ගයේම රබර් නිෂ්-පාදනය කිරීමේ පහසුකම් ඇති බවට ගණන් බලා ඇත. දෙවර්ගයේම රබර් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මැනවින් සවි කිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසුම් කළහොත්, එක් වර්ගයක නිෂ්පාදනයේ සිට අනෙක් වර්ගයේ නිෂ්පාදනය සඳහා වැඩි අපහසු කමකින් තොරව සිය නිෂ්පාදන කටයුතු මාරු කිරීමට විශාල වතුවලට හැකි වනු ඇත. රජය සතු රබර් වතුවල කේන්ද්‍රාපසාරී ලේටෙක්ස් රබර් නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව ගැන සොයා බැලීමද, මෙහිලා ප්‍රයෝජනවත් වනු ඇත. ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ඇතැම් වතුවල කේන්ද්‍රාපසාරී ලේටෙක්ස් රබර් නිෂ්පාදනය කිරීමේ පහසු කම් ඇති අතර, රටේ කේන්ද්‍රාපසාරී ලේටෙක්ස් රබර් ප්‍රමාණය වැඩි කිරීම සඳහා එම නිෂ්පාදන ධාරිතාවෙන් ප්‍රයෝජන ගත හැකි වනු ඇත. දැනට කේන්ද්‍රාපසාරී ලේටෙක්ස් රබර් ප්‍රයෝජනයට ගන්නා දේශීය ව්‍යාපාර ඇත. අමු ද්‍රව්‍ය සුලබ වන විට තවත් දේශීය මෙන්ම විදේශීය ව්‍යාපාරික ආයතන, අපනයනය පිණිස ලේටෙක්ස් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනයෙහි ආයෝජනය කිරීමට පෙළඹිය හැකි අතර, එමගින් ස්වාභාවික රබර් ආශ්‍රිත නිෂ්පාදනවල එකතු කරන ලද වටිනාකම් කොටස රට තුළදීම වැඩිකර ගත හැකි වනු ඇත

1980 අවසානය වන විට රබර් තොග කිලෝ ග්‍රෑම් දශලක්ෂ 60 ක් පමණ වී යැයි රබර් පාලක විසින් ගනන් බලා ඇත. එසේ වුවද, ස්වාධීනව කරන ලද සමහර ගණන් බැලීම් අනුව මුළු රබර් තොගය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 40 ක් පමණ වෙතැයි දක්වේ. ක්‍රම සම්පාදන සහ ආර්ථික විශ්ලේෂණ කටයුතු සඳහා නිවැරදි තොග සංඛ්‍යා ලබා ගැනීමේ වැදගත් කම සුළු කොට නොතැකිය යුතුය.

## පොල්

ගෙඩි දශ ලක්‍ෂ 2,026 ක් ලෙස ගණන් බලා ඇති 1980 වර්ෂයේ පොල් නිෂ්පාදනය, ඉකුත් වර්ෂයට වඩා සියයට 15 කින් පහත වැටී ඇත. මෙය පසුගිය වර්ෂ දෙක තුළ දක්නට ලැබුණු නිෂ්පාදනය වැඩි වීමේ උපනතියේ පසුබෑමක් වූ අතර, හැත්තෑ ගණන් මුල කොටසේ සටහන්ව පැවති ගෙඩි දශ ලක්ෂ 2,500 ඉක්මවූ සාමාන්‍ය නිෂ්පාදන ප්‍රමාණයට වඩා බෙහෙවින් පහත් මට්ටමකි. 1979 වර්ෂය හා සසඳන විට නිෂ්පාදනයේ පහත වැටීම නිසා අපනයනය සඳහා ඉතිරිව පැවති ගෙඩි ප්‍රමාණය දශ ලක්ෂ 390 කින් පමණ පහත වැටිණි. 1979 අවසන් භාගයේදී හා 1980 මුල භාගයේදී දිවයිනේ බල පැවැත්වුණු නියඟය පොල් නිෂ්පාදනයේ මෙම සැළකිය යුතු පහත වැටීමට ප්‍රධාන හේතුව වී ඇත.

මෑත වර්ෂවල පොහොර භාවිතයේ සැළකිය යුතු වැඩි වීමක් දක්නට ලැබුනද, පොල් ඉඩම්වල පොහොර භාවිතය අනුමත කරන ලද උපරිම ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පැවතින යහපත් කාලගුණික තත්ත්වයන් නිසා, වර්ෂයේ මැද භාගයේ සිට පොහොර භාවිතය වැඩි විය 1980 වර්ෂය තුළදී පොල් අනු අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 55,800 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 12 ක වැඩි වීමක් දැක්විය. 1980 දී බල පැවැත්වුණු සහනාධාර සහිත පොහොර මිළ ගණන්, ඉහළ නැගෙමින් පැවති පොහොර ආනයන මිළ ගණන් වලින් නිෂ්පාදකයින් මනාව ආරක්‍ෂා කරනු ලැබීය. 1979 මුල් කොටසේ සිට රජය සතු බැංකු දෙක මගින් ක්‍රියාත්මක කරන ලද පොල් පොහොර ණය යෝජනා ක්‍රමයද, 1980 වර්ෂය තුළ පොහොර භාවිතයේ වැඩි වීමට උපකාරී විය.

**1 · 11 සංඛ්‍යා සටහන**

**පොල් නිෂ්පාදන සංඛ්‍යා 1978 – 1980**

| ශීර්ෂය | ඒකකය | 1978 | 1979 | 1980 (අ) |
|---|---|---|---|---|
| 1· නිෂ්පාදනය (ආ) | ගෙඩි දශ ලක්ෂ | 2,207 | 2,393 | 2,026 |
| 1·1 කපාපු පොල් | ගෙඩි දශ ලක්ෂ (ඇ) | 283 | 272 | 217 |
| 1·2 පොල් තෙල් | ගෙඩි දශ ලක්ෂ (ඇ) | 641 | 803 | 500 |
| 1·3 කොප්පරා (ඈ) | ගෙඩි දශ ලක්ෂ (ඇ) | 5 | 5 | 1 |
| 1·4 දේශීය පරිභෝජනය | ගෙඩි දශ ලක්ෂ (ඉ) | 1,278 | 1,302 | 1,326 |
| 2· සාමාන්‍ය මිළ | | | | |
| 2·1 කොළඹ | ගෙඩිය රුපියල් | 0·85 | 1·00 | 1·48 |
| 2·2 අපනයන නැ·වි·ස· | ගෙඩිය රුපියල් | 1·85 | 2·40 | 3·13 |
| 3· පොහොර නිකුතුව | මෙ. ටො. දහස් | 42·6 | 49·7 | 55·8 |
| 4· නිෂ්පාදන පිරිවැය | ගෙඩියට රුපියල් | 0·33 | 0·37 | 0·40 |
| 5· අපනයන ඉපැයුම් | රුපියල් දශ ලක්ෂ | 1,271 | 1,699 | 1,234 |
| | (විගැහි දශ ලක්ෂ) | (65) | (84) | (57) |
| 5·1 මද නිෂ්පාදනයන් | රුපියල් දශ ලක්ෂ | 972 | 1,298 | 754 |
| | (විගැහි දශ ලක්ෂ) | (50) | (64) | (35) |
| 5·2 අනෙකුත් නිෂ්පාදනයන් | රුපියල් දශ ලක්ෂ | 299 | 401 | 480 |
| | (විගැහි දශ ලක්ෂ) | (15) | (20) | (22) |
| 6· එකතු කළ වටිනාකම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඊ) | | 5·2 | 4·9 | 5·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික.
(ආ) ගණනය කරන ලද.
(ඇ) සමාන ගෙඩි ප්‍රමාණය පරිවර්තනය කළේ:
කපාපු පොල් මෙ. ටො. 1 = ගෙඩි 6,800
පොල් තෙල් මෙ. ටො. 1 = ගෙඩි 8,000
කොප්පරා මෙ. ටො. 1 = ගෙඩි 4,925
(ඈ) අපනයන පමණි.
(ඉ) ඒකපුද්ගල පරිභෝජනය වසරකට ගෙඩි 90 ක් යන පදනම මත ඇස්තමේන්තු කර ඇත.
(ඊ) වගා කිරිමේ හා සැකසුම් කටයුතුවල පමණි.

1979 රජයේ අයවැය ලේඛනය මගින් ප්‍රකාශයට පත් කරන ලද අළුතින් වගා කිරීමේ හා නැවත වගා කිරීමේ සහනාධාර වැඩි කිරීම නිසා 1980 දී එම වගා කටයුතුවල ප්‍රබෝධයක් ඇති වූ බව පෙනී යයි. නැවත හා අළුතින් වගා කළ බිම් ප්‍රමාණයන් පිළිවෙලින් හෙක්ටයාර 2,742 ක් සහ 2,089 ක් වූ අතර, ඒවායේ වැඩි වීම පිළිවෙලින් සියයට 59 ක් සහ 80 ක් ලෙස වාර්තා විය. විමසුමට ලක්ව ඇති වර්ෂය තුළදී, පොල් ඉඩම් හෙක්ටයාර 13,000 ක්ද පුනරුත්ථාපනය කරන ලද අතර එය ඉකුත් වර්ෂයට වඩා දෙගුණයක පමණ වැඩි වීමකි. විශේෂයෙන්ම, වසර ගණනාවක් තිස්සේ නිෂ්පාදනයෙන් ඉවත් වුනු විශාල පොල් ඉඩම් ප්‍රමාණය පිළිබඳව සළකා බලන කළ පොල් අනු අංශයේ වගා හා පුනරුත්ථාපන කටයුතුවල වැඩි වීම දිරි ගන්වන සුළුය. 1979 දී රුපියල් දශ ලක්ෂ 1·7 ක් හා රුපියල් දශ ලක්ෂ 2·5 ක්වූ නැවත හා අළුතින් වගා කිරීම සඳහා ගෙවන ලද සහනාධාර ප්‍රමාණයන්, 1980 දී පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 3·4 ක් හා රුපියල් දශ ලක්ෂ 0·7 ක් විය. පුනරුත්ථාපනය සඳහා 1979 දී ගෙවන ලද රුපියල් දශ ලක්ෂ 2·8 ක් වූ සහනාධාර ප්‍රමාණය, 1980 දී රුපියල් දශ ලක්ෂ 6·7 ක් විය. 1979 අයවැයෙන් ප්‍රකාශයට පත් කරන ලද පොල් ඉඩම්වල මිශ්‍ර වගාවන් සඳහා දෙන ලද සහනාධාර වැඩි කිරීම කෙරෙහි දක්වන ලද අනුකූලතාවයද දිරිගන්වන සුළුය. 1979 දී මිශ්‍ර වගාවන් සඳහා යෙදවුණු බිම් ප්‍රමාණය හෙක්ටයාර 306 ක් වූ අතර, 1980 දී එය හෙක්ටයාර 573 ක් විය.

නියඟය නිසා, සපයන ලද පොල් ගෙඩි ප්‍රමාණය අඩු වූ නිසා 1980 දී කපාපු පොල් හා පොල් තෙල් නිෂ්පාදනය බෙහෙවින් පහත වැටුණි. වරින් වර විදුලි බලය කපා හැරීම, කපාපු පොල් නිෂ්පාදනය කෙරෙහි අහිතකර අන්දමින් බලපෑවේය. අනෙක් අතට, 1980 මුල් කාලයේ කපාපු පොල් නිෂ්පාදනය අඩු වීමට බලපෑ එක් හේතුවක් ලෙස පෙනී යන්නේ, අපනයන අධෛර්යමත් කෙරෙන තරම් ඉහළ මට්ටමකින් අවම නැ·වි·ස· මිලක් බලධාරීන් විසින් පවත්වාගෙන යාමය. වර්ෂයේ දෙවන භාගයේදී අවම නැ·වි·ස· මිළ අඩු කිරීම නිෂ්පාදනය හා අපනයනයන් වැඩි වීමට හේතු විය. ලාභදායක නමුත් බෙහෙවින් තරඟකාරී ස්වරූපයක් උසුලන කපාපු පොල් සඳහා වූ ලෝක වෙළඳපොල කෙරේ ශ්‍රී ලංකාවේ බලපෑම අවශ්‍යයෙන්ම පවත්වා ගත යුතුය. නිෂ්පාදනය හා අලෙවි කටයුතු සම්බන්ධව මැදිහත් වීමට යාමෙන් විදේශ විනිමය උපයන මෙම වැදගත් මූලය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවිය හැකිය. දිවයිනේ අළුතින් කපාපු පොල් මෝල් විවෘත කිරීම සම්බන්ධයෙන් කලින් පවත්වා ගෙන යනු ලැබූ දැඩි පාලනය නිසා පවත්නා පැරණි මෝල් නිෂ්පාදනයෙන් ඉවත් වීම හේතු කොට ගෙන නිෂ්පාදන ධාරිතාව අඩු වී ඇත. මෙම ප්‍රතිපත්තිය නිසා දැනට නිෂ්පාදනයේ රැඳී සිටින මෝල් වලට එක්තරා ප්‍රමාණයක රැකවරණයක් සැලසී ඇති අතර, එය කර්මාන්තය නවීකරණය කිරීමේ දිගුකාලීන වැදගත්කම අනුව සළකා බලන කළ හිතකර නොවේ. කෙසේ වුවද, අළුතින් කපාපු පොල් නිෂ්පාදන මෝල් විවෘත කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත් පොල් කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෑතක සිට පිළිගෙන තිබීම දිරිගන්වන සුළු කරුණකි. පොල් තෙල් නිෂ්පාදනය පිළිබඳව සළකා බැලීමේදී, වර්ෂයේ වැඩි කාලයක් මුළුල්ලේ බල පැවැත්වූ අපනයන තහනම සහ නියඟය හේතුවෙන් සැපයුනු පොල් ගෙඩි ප්‍රමාණයද අඩු මට්ටමක පැවතීම නිසා නිෂ්පාදනයේ කැපී පෙනෙන අඩු වීමක් සිදු විය.

පොල් ගෙඩි සැපයුම අඩුවීම නිසා දේශීය වෙළෙඳ පොලෙහි පොල් මිල ඉහළ යාම 1980 දී දක්නට ලැබුණු විශේෂ ලක්ෂණය විය. දේශීය මිල ගණන් තවදුරටත් ඉහළ යාම වැළැක්වීම පිණිසත්, ප්‍රමාණවත් දේශීය සැපයුමක් සහතික කෙරෙනු පිණිසත්, කපාපු පොල් හැර, පොල් ගෙඩි සහ පොල් මද නිෂ්පාදනයන් අපනයනය කිරීම සම්බන්ධයෙන් බලධාරීන් විසින් දැඩි නීති පනවන ලදී. මෙසේ 1979 දී සීමා කිරීම් සහ පාලනය නීති ලිහිල් කිරීම සඳහා පැවති ඉඩකඩ 1980 දී ඉවත්ව ගොස් ඇත. කෙසේ වුවද, කලින් පැවති රු. 1 ක මිළ ඉලක්කය හා සසඳා බලන කල පොල් ගෙඩියක් සඳහා රු. 1·25 ක ඉහළ මිලක් පොල් නිෂ්පාදකයිනට ලබා ගැනීමට හැකිවන පරිදි, 1980 ජුනි මාසයේදී පරිපාලන බද්ද ප්‍රතිශෝධනය කරනු ලැබීමෙන්, නිෂ්පාදකයිනට එක්තරා සහනයක් ලබා දුනි. පරිපාලන බද්ද තීරණය කිරීමේදී කලින් කලට ඇතිවන නිෂ්පාදන වියදම් ඉහළ යාම පිළිබඳව සැළකිලිමත් විය යුතුය.

කලින් වාර්ෂික වාර්තාවලද දක්වූ පරිදි කර්මාන්තයේ දිගු කාලීන සංවර්ධනය රඳා පවත්නේ පාරිභෝගිකයාගේ මෙන්ම නිෂ්පාදකයාගේද අවශ්‍යතාවයන් එක්කර ගැනීම මිතය පාරිභෝගික මිල ගණන් යථාරූපී මට්ටමක පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වන අතරම, පොල් වගා අංශය, එක් තැනක පවතින හෝ පිරිහෙමින් පවතින අංශයක් වීමෙන් වැළැක්වීම සඳහා එහි ආයෝජනයන් දිරි ගැන්වීමද අවශ්‍යය. 1980 වර්ධනයන්ගෙන් පෙනී යන්නේ ප්‍රතිපත්තීන් තවමත් පාරිභෝගිකයාගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා යොමු වී ඇති බවයි. දීර්ඝකාලීන වශයෙන් බලන කල, පාරිභෝගික ශුභසිද්ධිය උදා කරගත හැක්කේ නිෂ්පාදනය පුළුල් කිරීමෙන් පමණි.

**සුළු අපනයන භෝග**

සුළු අපනයන භෝග නිෂ්පාදනයේ විශේෂ ලක්ෂණය වන්නේ ' මිශ්‍ර වගා ඉඩම් ' හෝ ' ගෙවතු ' වශයෙන් පුළුල්ව විසිර ගිය වගා ඒකකයන්ගෙන් සමන්විත වීමය. එබැවින් නිෂ්පාදන පරිමාව පිළිබඳව නිවැරදි සංඛ්‍යා තොරතුරු පහසුවෙන් ලබා ගත නොහැකිය. කෙසේ වුවද, මෙම භෝගයන්ගෙන් බොහොමයකම දේශීය පරිභෝජනය, මුළු නිෂ්පාදනයෙන් ඉතාමත් සුළු කොටසක් වන නිසා අපනයනය කරන ලද සුළු අපනයන භෝග පරිමාව නිෂ්පාදනයට ඉතාමත් ආසන්න වශයෙන් සැළකේ.

අපනයන පරිමාව අනුව බලන කල, පුවක්, කරාබු නැටි සහ කුරුඳු නිෂ්පාදනයන් 1980 දී සැළකිය යුතු ලෙස වැඩි වී ඇත. තෙල් ලබා ගන්නා ඇට වර්ග, කොකෝවා නිෂ්පාදනයන්, අබ සහ කජු නිෂ්පාදනයන්ද 1979 වර්ෂයේ නිෂ්පාදනයට වඩා වැඩි වී ඇත. අනෙක් අතට, කෝපි, ගම්මිරිස්, සාදික්කා, කරදමුංගු, තල, බුලත්, දුම්කොළ, පැපොල් කිරි සහ වාෂ්පශීලී තෙල් අපනයන පරිමාවන් පහත වැටී ඇතැයි වාර්තා වී ඇත. කෙසේ වුවද, මෙම භෝගයන්හි අපනයන පරිමාවේ අඩු වීමට බලපෑ සාධකයන් වශයෙන් දැක්විය හැක්කේ, දේශීය පරිභෝජනය වැඩි වීම සහ පොදු වශයෙන් නිෂ්පාදනයට බලපෑ අයහපත් කාලගුණයයි.

සුළු අපනයන භෝග ආධාර ක්‍රමය යටතේ 1980 දී වගා කළ මුළු බිම් ප්‍රමාණය, ඉකුත් වසරට වඩා වැඩි වී ඇත්තේ ඉතාමත් සුළු ප්‍රමාණයකිනි. වගා කරන ලද බිම් ප්‍රමාණය සැළකිය යුතු අයුරින් වැඩිවී ඇත්තේ කරාබු සම්බන්ධයෙන් පමණි. 1979 දී හෙක්ටයාර 202 ක් වූ කරාබු වවන ලද බිම් ප්‍රමාණය මෙම වර්ෂයේදී හෙක්ටයාර 387 ක් විය.

**වී**

1980 වර්ෂය තුළදී වී වගා අංශයේ ඇති වූ සිත්ගන්නා සුළු දියුණුව, නුදුරු අනාගතයේ රට සහලින් ස්වයංපෝෂිත වීමේ බලාපොරොත්තු ඇති කරලීය. ආර්ථිකය දැන් වී නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත වීමේ අවස්ථාවට එළඹ ඇත.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 1980 වර්ෂයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2·1 ක් (වී බුසල් දශ ලක්ෂ 102·2 ක් හෝ සහල් මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1·5) ලෙස ගණන් බලා ඇති අතර, මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 11 ක වැඩිවීමකි. 1979/80 මහ කන්නයේ ගණන් බලන ලද වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1·5 (බුසල් දශ ලක්ෂ 69·6) ක්වූ අතර, එය සියයට 4·3 ක වැඩිවීමකි. 1980 යල කන්නයේ ගණන් බලා ඇති නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 0·7 (බුසල් දශ ලක්ෂ 32·6) ක් විය. මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 30 ක වැඩිවීමකි. නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වැඩිවීමට දායක වූ හේතූන් අතර විචිත්‍ර වෙළඳපලේ වී සඳහා පැවති බෙහෙවින් යහපත් මිළ ගණන් හා විශේෂයෙන් කලාවැව ප්‍රදේශයේ වගා කළ බිම් ප්‍රමාණය පුළුල් වීමද දැක්විය හැකිය. අස්වැන්නද සැහෙන ප්‍රමාණයකින් එනම්, 1979 වර්ෂයේ හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2,750 (අක්කරයකට බුසල් 53) සිට 1980 වර්ෂයේදී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2,927 (අක්කරයකට බුසල් 56) දක්වා වැඩිවිය. මෙම වැඩිවීමට විශාල වශයෙන් බලපෑවේ පොහොර භාවිතය වැඩිවීම, වඩා හොඳ වගා පිළිවෙත් අනුගමනය කිරීම, පුළුල් ව්‍යාප්ති සේවාවන්, යහපත් කාලගුණික තත්වයන් යන කරුණුය. 1980 වර්ෂයේදී වපුල බිම් ප්‍රමාණය

ඉකුත් වසරට වඩා හෙක්ටයාර 6,000 ක හෙවත් සියයට 1 ක වැඩිවීමක් පෙන්විය. වර්ෂය තුළදී වගා හානි වීම් වාර්තා වූයේ අඩු ප්‍රමාණයකි. වපුල බිම් ප්‍රමාණය හා අස්වනු නෙලාගත් බිම් ප්‍රමාණය අතර වෙනස ඉකුත් වසරේ හෙක්ටයාර 56,000 ක් හෙවත් සියයට 6·6 හා සසඳන කල, 1980 වර්ෂයේදී හෙක්ටයාර 29,000 හෙවත් සියයට 3 ක් විය.

වී වගාව සඳහා නිකුත් කළ පොහොර ප්‍රමාණය 1979 වර්ෂයේ මෙට්‍රික් ටොන් 73,603 ක සිට 1980 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 1,45,110 දක්වා ඉහළ යමින්, දෙගුණයකින් පමණ වැඩි විය මේ අනුව, 1979 සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කෙරුණු පොහොර සහනාධාරයේ වැඩිකිරීම නිසා 1979/80 මහ කන්නයේදී සහ 1980 යල කන්නයේදී පොහොර භාවිතය වැඩි කිරීමේ අපේක්ෂිත අරමුණ ඉටු වූ අතර, එය 1978 වර්ෂයටත් වඩා සියයට 35 කින් වැඩි විය. කුරුණෑගල, අම්පාර හා යාපනය යන දිස්ත්‍රික්කවල පොහොර භාවිතයේ විශාල වැඩි වීම් වාර්තා විය. කෙසේ වුව ද, මීට පටහැනිව ප්‍රධාන වශයෙන් වී නිෂ්පාදනය කෙරෙන පොළොන්නරුව හා අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි පොහොර භාවිතය සැළකිය යුතු අයුරින් පහත වැටුනි.

**1 · 12 සංඛ්‍යා සටහන**

**වී සංඛ්‍යා 1979-1980**

| ශීර්ෂය | ඒකකය | 1979 | | | 1980(අ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුල දළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 578 | 261 | 839 | 574 | 271 | 845 |
| පොහොර නිකුතුව .. | මෙ. ටොන් දහස් | 44 | 30 | 74 | 92 | 53 | 145 |
| දෙන ලද ණය ප්‍රමාණය .. | රුපියල් දශ ලක්ෂ | 60 | 14 | 74 | 46 | 14 | 60 |
| වැඩි දියුණු කළ වී වර්ග යටතේ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 448 | 200 | 648 | 487 | 196 | 683 |
| අස්වැන්න නෙලන ලද දළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 551 | 232 | 783 | 555 | 261 | 816 |
| හෙක්ටයාරයක පලදාව .. | කි. ග්‍රෑ | 2,819 | 2,574 | 2,750 | 2,950 | 2,886 | 2,927 |
| නිෂ්පාදනය .. | මෙ. ටොන් දහස් | 1,393 | 524 | 1,917 | 1,453 | 680 | 2,133 |
| සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම .. | මෙ. ටොන් දහස් | 464·3 | 76·9 | 541·2 | 210·5 | 0·8 | 211·3 |
| ආනයන (වී සමානය) .. | මෙ. ටොන් දහස් | 168 | 136 | 304 | 176 | 134 | 310 |

(අ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

කුරුණෑගල, අම්පාර හා කොළඹ දිස්ත්‍රික්කයන්හි හා උඩවලවේ ප්‍රදේශයෙහිද යල සහ මහ යන කන්න දෙකෙහිම සැළකිය යුතු ප්‍රමාණයක අස්වනු වැඩිවීම් වාර්තා විය.

වගා කළහැකි බිම්වල හිඟය ගැන සළකා බලන කල කෘෂිකාර්මික සංවර්ධනයේදී යොදා ගැනෙන උපක්‍රමයන්හිදී, බිම් ඒකකයක ඵලදායිතාව වැඩි කිරීම සම්බන්ධයෙන් වැඩි ප්‍රමුඛත්වයක් දිය යුතුය. මේ සම්බන්ධයෙන් ක්‍රමවත් පරිදි සහ ඉහළ පොහොර භාවිතයේ ඇති වැදගත්කම ගැන අවධාරණය කළ යුතුව ඇත. කෘෂිකාර්මික යෙදවුම් වලින් සහ සළසා ඇති අනෙකුත් පහසුකම්වලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට නම් අනෙකුත් උපයෝගී සේවාවන් ද පවත්වාගෙන යා යුතු ය.

සහතික මිළ ක්‍රමය යටතේ වී අලෙවි මණ්ඩලය මගින් මිළදී ගත් වී ප්‍රමාණය 1980 දී සියයට 50 කින් පහත වැටුනි. වී අලෙවි මණ්ඩලය මගින් 1980 තුළදී මිළදී ගත් වී ප්‍රමාණයෙන් සියයට 98 ක් පමණ මිළදී ගනු ලැබුයේ වර්ෂයේ මුල් භාගයේදීය. යල කන්නයේ අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය මිළදී ගත් වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 772 (බුසල් 37,000) ක්වූ අතර, එය ඉකුත් වර්ෂයේ යල කන්නයේ මිළ දී ගත් ප්‍රමාණයෙන් සියයට 1 ක් පමණ විය. පසුගිය වර්ෂයේ මෙන්ම වී අලෙවි මණ්ඩලය විශාල වශයෙන් වී මිළ දී ගනු ලැබුයේ විශේෂයෙන්ම වියළි කලාපයේ අනුරාධපුර, මන්නාරම, අම්පාර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වලිනි.

1980 ජූනි මාසයේ පමණ සිට පෞද්ගලික වෙළෙඳුන්ගේ දැඩි තරඟය නිසා වී අලෙවි මණ්ඩලයට සැළකිය යුතු ප්‍රමාණයක් වී මිලට ගැනීමට බෙහෙවින් අපහසු විය. 1980 නොවැම්බර් මාසය වන තෙක් වී සඳහා ගෙවන සහතික මිල රු. 40 ක්ව පැවති අතර, ජනවාරි ජූනි අතර කාලය තුළදී විවෘත වෙළඳපොලේ වී බුසලක සාමාන්‍ය මිළ රුපියල් 46 ක් පමණ විය. වී අලෙවි මණ්ඩලය 1980 නොවැම්බරයේදී වී බුසලක සහතික මිළ රු 50 දක්වා වැඩිකළ විට බොහෝ දිස්ත්‍රික්කයන්හි විවෘත වෙළෙඳ පලේ වී බුසලක සාමාන්‍ය මිළ රු. 60 කටත් වඩා වැඩි විය.

වී අලෙවි මණ්ඩලයේ සහල් විකුණනු ලබන මිළ විවෘත වෙළඳපොලේ මිලට වඩා බෙහෙවින් අඩුවීම නිසා එහි සිය අලෙවි සැල් මගින් විකුණු සහල් ප්‍රමාණය සැළකිය යුතු ලෙස වැඩි විය කෘෂිකාර්මික යෙදවුම් මිළද ඇතුළුව පොදු මිළ ඉටටම ඉහළ යමින් පැවැති අවස්ථාවකදී, වී අලෙවි මණ්ඩලය ඒකාධිකාරීව කටයුතු කළේ නම්, ගොවීන්ට පවත්නා ඵලද හා මූර්ත ආදයම් මට්ටම් පවා පවත්වාගෙන යාමට අපහසු විය හැකිව තිබුණි. එසේ වූවද වී අලෙවි මණ්ඩලයේ කාර්ය භාරය 1980 තුළදී බෙහෙවින් වෙනස් විය. පදනම් මිළ ක්‍රියාත්මක කරන්නකු ලෙස වී අලෙවි මණ්ඩලයට පැවරී ඇති වැදගත් කාර්යය අඩුවෙන් තක්සේරු කළයුතු නොවේ. කලින් වාර්ෂික වාර්තාවේද සඳහන් කළ පරිදි වී/සහල් වෙළඳපලේ සිදුව ඇති වෙනස්කම් සලකා බලන කල ඒ ඒ ආයතනවල කටයුතු එකිනෙක හා ගැටීම හැකිතාක් අඩුකරලීම සඳහා වී/සහල් අලෙවි කටයුතුවල නියුතු රජය සතු ආයතන ප්‍රති සංවිධානය කිරීමෙන් හා ඒකාබද්ධ කිරීමෙන් වී සහ සහල් අලෙවි කිරීමේ මුළු මහත් ක්‍රියාවලියම වඩාත් විධිමත් කළයුතු කාලය එළඹ ඇත.

**සීනි**

1980 වර්ෂයේ ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 26,300 ක් ලෙස ගණන් බලා ඇති අතර, මෙය 1979 වර්ෂයේ නිෂ්පාදනය හා සසඳන කළ සියයට 43 ක වැඩි වීමකි. හිඟුරාන සහ කන්තලේ සීනි කම්හල්වල නිෂ්පාදනය පිළිවෙලින් සියයට 28 ක සහ 60 ක වැඩිවීම් දක්වීය.

හිඟුරාන ප්‍රදේශයේ අස්වනු කපා ගත් බිම් ප්‍රමාණය සියයට 9 ක අඩු වීමක් දක්වූවද එම ප්‍රදේශයේ උක් වැවූ බිම් ප්‍රමාණය බොහෝ දුරට ඉකුත් වසරේ වැවූ බිම් ප්‍රමාණයට සමාන විය එසේ වූවද හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව 1979 දී මෙට්‍රික් ටොන් 41 සිට 1980දී මෙට්‍රික් ටොන් 57 දක්වා වැඩිවී ඇත. වැඩියෙන් ජලය ලබාගත හැකිවීම, 1978 සුළි සුළඟෙන් විනාශ වූ උක් වගාවන් නැවත ප්‍රකෘති තත්වයට පත් වීම සහ කපා ගත් අස්වනු ප්‍රමාණය සැළකිය යුතු ලෙස වැඩි කර ගැනීමට හේතු වූ මනා පාලන පිළිවෙත් යන කරුණු ඵලදාවේ මෙම වැඩි වීමට හේතු වූ නිසා අස්වනු නෙළාගත් උක් දඩු ප්‍රමාණය සැළකිය යුතු පරිදි වැඩිවිය.

කන්තලේ ප්‍රදේශයේ වගා කරන ලද සහ අස්වනු කපා ගත් බිම් ප්‍රමාණය බොහෝදුරට ඉකුත් වර්ෂයේ ප්‍රමාණයට සමාන විය. එසේ වුවද, මෙම ප්‍රදේශයේද, හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව 1979 දී මෙට්‍රික් ටොන් 39 සිට 1980 දී මෙට්‍රික් ටොන් 51 දක්වා වැඩිවී ඇත. ඒ අනුව නෙළාගත් අස්වනු ප්‍රමාණය සියයට 32 කින් වැඩි වී ඇත. මහවැලි ජලය ලබාගත හැකි වීම සහ දියුණු වූ පාලන හා වගා පිළිවෙත් අනුගමනය කිරීම යන කරුණු කන්තලේ ප්‍රදේශයේ මෙම මනා ක්‍රියාකාරිත්වයට හේතු විය.

වර්ෂයේ වාර්තාවී ඇති සීනි නිෂ්පාදනය යථා තත්වයට පත්වීමේ වේගයෙන් පෙන්නුම් කරන පරිදි, කම්හල්වල මෙහෙයවුම් කාර්යක්‍ෂමතාවද සුළු වශයෙන්, එහෙත් හිතකර ලෙස දියුණු වී ඇති බව පෙනේ. එසේ වූවද, සීනි නිපදවන ප්‍රධාන රටවල් වල, දක්නට ලැබෙන සීනි නිෂ්පාදනය යථා තත්වයට හැරීමේ වේගයට වඩා මෙය බෙහෙවින් අඩු මට්ටමක පවතින බවද මෙහි ලා සඳහන් කළ යුතුය. යථා තත්වයට හැරීමේ වේගය දියුණු කිරීමෙන්, අඩු පිරිවැයක් සහිතව වැඩි නිපැයුමක් ලබා ගත හැකි වනු ඇත.

**අතුරු ආහාර භෝග**

පසුගිය වසර කිහිපය තුළ ලැබූ අත්දැකීම්වලට පටහැනිව අතුරු ආහාර භෝග නිෂ්පාදනය 1980 වර්ෂය තුලදී ඉහළ යාමක් පෙන්නුම් කළේය. බොම්බයි ළූණු, මඤ්ඤොක්කා හා ඉදල් ඉරිඟු හැර අනෙක් සියළු භෝගයක්ම පාහේ වගාකළ බිම් ප්‍රමාණයෙහි වැඩි වීමක් පෙන්නුම් කළ අතර, මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනයේ වැඩිවීම් දක්නට ලැබුනි.

1980 වර්ෂය තුලදී අතුරු භෝග අංශයේ දක්නට ලැබුණු ප්‍රගතියට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පිටි හා පාන් මිල වැඩිවීම නිසා මෙම භෝග වගාව වඩා වාසිදයක වීම විය හැකිය. පොහොර සහනාධාරය වැඩිවීම නිසා, අතුරු ආහාර භෝග අංශයේද පොහොර භාවිතය වැඩිවිය.

ධීවර හා පශු නිෂ්පාදන.

ධීවර අමාත්‍යාංශයේ තාවකාලික ගණන් බැලීම් අනුව, 1980 වර්ෂයේ මාළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 183,291 ක් වූ අතර, මෙය 1979 වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 9 ක වැඩිවීමකි. යාන්ත්‍රීකරණ වැඩ පිළිවෙල යටතේ යාන්ත්‍රික බෝට්ටු විශාල සංඛ්‍යාවක් නිකුත් කිරීම, ධීවර ආම්පන්න හා අනෙකුත් යෙදවුම් පහසුවෙන් සහ වැඩියෙන් ලබා ගත හැකි වීමද යන කරුණු මෙම වැඩිවීමට බලපෑ ප්‍රධාන හේතුන් අතර විය. මෙයට දයකවූ තවත් සාධකයක් වූයේ යාන්ත්‍රීකරණ හා සුළි සුළං පුනරුත්ථාපන වැඩ පිළිවෙලවල් යටතේ ගෙවනු ලැබූ ඉහළ මට්ටමේ සහනාධාරයන්ය. 1980 වර්ෂය සඳහා මෙම සහනාධාර වෙනුවෙන් වැය කළ මුදල රුපියල් දශ ලක්ෂ 55·5 ක් වූ අතර, එය පසුගිය වසරේ ගෙවූ සහනාධාර ප්‍රමාණයට වඩා සියයට 43 ක වැඩිවීමකි.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් තාවකාලිකව ගණන් බලා ඇති පරිදි, 1980 වර්ෂයේ කිරි නිෂ්පාදනය (මී කිරි ද ඇතුළුව) ලීටර් දශ ලක්ෂ 283 ක් වූ අතර. මෙය 1979 වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 9 ක වැඩිවීමකි කෙසේ වුවද, දිවයිනේ මුළු කිරි නිෂ්පාදනයෙන් සියයට 25 ක් පමණ වන මී කිරි නිෂ්පාදනය, ඉකුත් වසර හා සසඳන කල 1980 දී වැඩි වූයේ සියයට 5 කින් පමණි. ජාතික කිරි මණ්ඩලය 1980 වර්ෂයේදී කිරි ලීටර් දශ ලක්ෂ 61·8 ක් එකතු කළ අතර, මෙය ඉකුත් වර්ෂයට වඩා සුළු වශයෙන් අඩුවීමකි. ජාතික කිරි මණ්ඩලයේ කිරි එකතු කිරීම අඩුවීමට බලපෑ එක් හේතුවක් විය හැක්කේ, ආයතනය තුල පැවති කාර්මික ආරවුල් විය හැකිය. කිරි එකතු කිරීමේදී පෞද්ගලික අංශයෙන් ඇතිවූ තරඟකාරිත්වය වැඩිවීමද තවත් හේතුවකි.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් දශ ලක්ෂ 544 ක් ලෙස තාවකාලිකව ගණන් බලා ඇති, 1980 බිත්තර නිෂ්පාදනය ඉකුත් වර්ෂයට වඩා සියයට 26 ක වැඩිවීමක් පෙන්වීය. විශාල පරිමාණයේ නිෂ්පාදකයන් කිහිප දෙනෙකු කර්මාන්තයට පිවිසීම සහ 1980 සැප්තැම්බර් මාසය දක්වා පැවති සිත්ගන්නා සුළු සත්වආහාර මිල ගණන්, මෙම නිෂ්පාදනය වැඩිවීමෙහි ලා බොහෝ දුරට හේතුවිය.

ග්‍රාමීය ණය

සපිරි ග්‍රාමීය ණය ක්‍රමය, ග්‍රාමීය බැංකු ණය ක්‍රමය සහ ගොවිජන සේවා මධ්‍යස්ථානවල පිහිටි ලංකා බැංකු උප කාර්යාල මගින් ග්‍රාමීය අංශයට දෙන ලද ණය ප්‍රමාණය 1980 වර්ෂයේදී සියයට හතරකින් අඩුව, රුපියල් දශ ලක්ෂ 101·9 ක් විය. 1979 දී තියුණු ලෙස පහත වැටුණු ග්‍රාමීය අංශයට දුන් ණය ප්‍රමාණය 1980 දී තව දුරටත් පිරිහී ඇති බැව් දක්නට ලැබුණි. 1979 දී දුන් ණය ප්‍රමාණය 1978 වර්ෂයේදී දුන් ණය ප්‍රමාණයට වඩා සියයට 67 කින් අඩු විය. 1980 වර්ෂයේදී ද වැඩිම ණය ප්‍රමාණයක් සපයා ඇත්තේ භෝග වගාව සඳහාය. මහජන බැංකුව සහ ග්‍රාමීය බැංකු රටේ ග්‍රාමීය අංශයට ණය සපයන ප්‍රධාන ආයතන වශයෙන් දිගටම පැවතින. වර්ෂය තුළ දුන් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 58 ක් නැතහොත් රුපියල් දශ ලක්ෂ 58·9 ක් සපයන ලද්දේ මෙම ආයතනයන් විසිනි. 1979 දී ග්‍රාමීය අංශයට දුන් ණයවලින් සියයට 30 ක් සැපයූ ග්‍රාමීය බැංකුවල දයකත්වය 1980 දී සියයට 39 දක්වා වැඩිවී ඇත. ලංකා බැංකුව වර්ෂය තුළ දෙන ලද මුළු ණය වලින් සියයට 42 ක් නැතහොත් දශ ලක්ෂ 43 ක් සැපයීය. සපිරි ග්‍රාමීයණය ක්‍රමය යටතේ දෙන ලද වගා ණය පිළිබඳ විස්තර සංඛ්‍යා පරිශිෂ්ඨයේ දක්වා ඇත.

සත්ව පාලනය, කුඩා පරිමාණ කර්මාන්ත සහ ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම වැනි කටයුතු සඳහා දෙන ලද ණය බොහෝ දුරට ඉකුත් වසරේ පැවති මට්ටමෙහිම පැවතින. 1980 නිවාස ඉදි කිරීම, විදුලිය සහ ජලය සැපයීම සඳහා දෙන ලද ණය සියයට 26 කින් වැඩිව රුපියල් දශ ලක්ෂ 23.4 ක් විය.

බැංකු ආයතන විසින් ග්‍රාමීය අංශයට සපයනු ලබන ණය ප්‍රමාණය බෙහෙවින් පහත වැටී ඇත. 1979 වර්ෂයේ සිට ණය දීමේදී බැංකු විසින් දැඩි පිළිවෙතක් අනුගමනය කළද ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් සැළකිය යුතු දියුණුවක් ලබා නැති බව සඳහන් කළ යුතුය. 1967 නව කෘෂිකාර්මික ණය ක්‍රමයේ ආරම්භයේ සිට 1980 යල කන්නය අග දක්වා වී වගාව සඳහා දෙන ලද රුපියල් දශ ලක්ෂ 1,209 ක මුළු ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 579 ක් පමණක් අය කරගනු ලැබූ අතර නොගෙවා පැහැර හැර ඇති ප්‍රමාණය සියයට 52 ක තරම් ඉහල මට්ටමක වේ. මෙම සංඛ්‍යාවලින්, ග්‍රාමීය අංශයට ණය දීමේදී පවත්නා වඩාත් මූලික ගැටළු සහ ආපසු අයකර ගැනීම් හැකිතාක් කඩිනම් කිරීම සම්බන්ධයෙන් ඇති අවශ්‍යතාව පෙන්නුම් කෙරේ.

## 1 . 13 සංඛ්‍යා සටහන

## ග්‍රාමීය ණය(අ) 1979 – 1980

රුපියල් දශ ලක්ෂ

| අරමුණ | මහජන බැංකුව(ආ) | | ග්‍රාමීය බැංකු | | ලංකා බැංකු උප කාර්යාල(ඇ) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1979 | 1980 | 1979 | 1980 | 1979 | 1980 | 1979 | 1980 |
| 1. භෝග වගාව .. .. | 25.8 | 19.6 | 4.6 | 4.4 | 25.5 | 21.0 | 55.9 | 45.1 |
| 1.1 වී .. .. | (20.5) | (16.0) | (1.0) | (1.1) | (17.7) | (13.5) | (ඈ) (39.2) | (ඈ) (30.7) |
| 1.2 අතුරු ආහාර භෝග .. | (5.3) | (3.4) | (3.6) | (3.3) | (7.5) | (7.5) | (16.4) | (14.2) |
| 1.3 උක් සහ කපු .. .. | ( — ) | (0.2) | (—) | (—) | (0.3) | (—) | (0.3) | (0.2) |
| 2. පශු පාලනය .. .. | | | 1.7 | 2.1 | 0.6 | 0.8 | 2.3 | 2.9 |
| 3. සුළු කර්මාන්ත .. .. | | | 1.4 | 2.1 | 0.9 | 0.4 | 2.3 | 2.5 |
| 4. යන්ත්‍ර සූත්‍ර හා මෙවලම් මිලට ගැනීම .. | | | — | — | 11.9 | 10.4 | 11.9 | 10.4 |
| 5. ණයෙන් මිදීම .. .. | | | 3.7 | 3.9 | — | — | 3.7 | 3.9 |
| 6. පරිභෝජනය .. .. | | | 1.0 | 1.1 | 0.5 | 0.6 | 1.5 | 1.7 |
| 7. නිවාස, විදුලිබලය සහ ජල සැපයුම .. | | | 15.8 | 20.7 | 2.6 | 2.7 | 18.5 | 23.4 |
| 8. වෙළඳාම සහ අනෙකුත් .. .. | | | 3.4 | 5.0 | 6.6 | 7.0 | 10.0 | 12.0 |
| එකතුව .. .. | 25.8 | 19.6 | 31.6 | 39.3 | 48.6 | 42.9 | 106.1 | 101.9 |

මූලයන්: මහජන බැංකුව;
ලංකා බැංකුව;
සී. ස. හැටන් නැෂනල් බැංකුව.

(අ) උකස් කිරීම් යටතේ වූ අයිරා සහ අත්තිකාරම් නොමැතිව.
(ආ) සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ පමණි.
(ඇ) සපිරි ග්‍රාමීය ණය යටතේ දුන් ණය ඇතුලත්ය.
(ඈ) සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ හැටන් නැෂනල් බැංකුව දුන් ණය ඇතුලත්ය.